# කාර්යසාධන වාර්තාව - 2015

## සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | ආයතනික ව්‍යුහය | |
| 1.1 | දැක්ම | 2 |
| 1.2 | මෙහෙවර | 2 |
| 1.3 | හැඳින්වීම | 3 |
| 1.4.1 | ප්‍රාථමික සංවර්ධන අංශය | 3 |
| 1.4.2 | ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය | 3 |
| 1.4.3 | සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය | 3 |
| 1.4.4 | සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම් | 3 |
| 1.4 | කාර්යයන් | 4 |
| 2. | 2015 වර්ෂයේ කාර්යය සාධනය | |
| 2.1 | සමාලෝචනය | 6 |
| 2.2 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය | 7 - 9 |
| 2.3 | ක්ෂුද්‍රමූල්‍යනය | 9 - 11 |
| 2.4 | කෘෂිකාර්මික ක්ෂේත්‍රය නඟා සිටුවීම | 11 - 21 |
| 2.5 | ආහාර සුරක්ෂිතතාව | 21 - 26 |
| 2.6 | ඉලක්කගත කණ්ඩායම් සඳහා වූ විශේෂ දිරි දීමනා | 26 - 29 |
| 3. | පරිපාලන හා මූල්‍ය කාර්යය සාධනය | |
| 3.1 | පරිපාලන අංශය | 30 - 36 |
| 3.2 | මූල්‍ය අංශය | 37 - 38 |
| 3.3 | විගණන විමසුම් | 39 |

## දැක්ම

*"සංවර්ධන මූල්‍ය සඳහා අවශ්‍ය පහසුකම් සපයන රජයේ ප්‍රධාන නියෝජිත ආයතනය බවට පත්වීම"*

## මෙහෙවර

*"අදාළ පාර්ශවන්ගේ මැදිහත්වීම ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම හා ප්‍රාථමික ව්‍යවසාය අංශය මූල්‍යනය හා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම"*

# හැඳින්වීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් 2005 ජනවාරි මස 01 වන දින මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. නිලධාරීන් අට දෙනෙකු ප්‍රමුඛ එකලොස් දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට සමස්ත කාර්ය මණ්ඩලය 29 දෙනෙකි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අංශ හතරක් යටතේ දැක්විය හැක. එනම්,

## 1. ප්‍රාථමික සංවර්ධන අංශය :

රජයේ සංවර්ධන සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික ආර්ථික සංවර්ධනය නංවාලීම, නැගී එන ආර්ථික කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම යනාදී නියාමන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

## 2. ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය :

දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ලොව පුරා පිළිගත් ක්‍රමවේදයක් වූ ක්ෂුද්‍රමූල්‍යනය පසුගිය දශක කිහිපය පුරා ලංකාව තුළ ද ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ පුළුල් භූගෝලීය ප්‍රදේශයක් පුරා ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් ව්‍යාප්තව පැවතුන ද ග්‍රාමීය ප්‍රදේශවල වාණිජ බැංකු හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පවතී. ක්ෂුද්‍රමූල්‍යනය, මධ්‍යම ආදායම් ලාභී කුටුම්භයන් හි ආදායම් හා වත්කම් වැඩි දියුණු කිරීමටත්, අඩු ආදායම් ලාභී කුටුම්භයන් හි පරිභෝජන වියදම් වැඩි කිරීමටත්, ඔවුන්ගේ ඉතිරිකිරීමේ පුරුද්ද වර්ධනය කිරීමටත්, සියළුම ආදායම් කාණ්ඩයන්හි පරිභෝජනය සුමට කිරීමේ මෙවලමක් ලෙසත්, කාන්තාවන්ගේ සාමාජීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් දායක වී ඇත.

## 3. සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය :

ශ්‍රී ලංකා රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය අංශය වැදගත් උපායමාර්ගික අංශය ලෙස හඳුනාගෙන ඇත. එම අංශය මඟින් ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා අවස්ථා උත්පාදනය හා දරිද්‍රතාවය තුරන් කිරීමට විශාල දායකත්වයක් ලබාදෙයි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය අංශය මඟින් ලංකාවේ සමස්ත ව්‍යවසායන්ගෙන් 75%ක් ද, සේවා නියුක්තියෙන් 45%ක් ද, දළ දේශීය නිෂ්පාදනයෙන් 52 ක ට ද දායකත්වය සපයන බැවින් එය මනාව ලාංකික ආර්ථිකය තුළ පිළිඹිබු වේ.

## 4. සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම් :

නිෂ්පාදකයින්ට තම වගාබිමේ දී ලබාදෙන මිල තහවුරු කරන අතරම ස්ථාවර වෙළඳ පොල මිලක් ලබා දීම සඳහා අතිරික්ත අස්වනු කළමනාකරණය කර කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ අනෙකුත් වෙළඳපොල සාධකයන් කෙරෙහි අවධානය යොමු කරමින් සැපයුම් අංශය සහ ඉල්ලුම් පාර්ශවය තුලනය කිරීම.

ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට වටිනා දායකත්වයක් ලබා දීමේ විභවයන් ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම හා නව ව්‍යවසායකයින් හඳුනා ගැනීම අරමුණු කරගෙන මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම යටතේ සහනදායී ණය, භාණ්ඩාගාර ඇපකර සහ තාක්ෂණික සහයන් සැපයීම ඇතුළු විවිධ රාජ්‍ය අනුග්‍රහයන් ලබා දීම සිදු කරනු ලබයි.

## දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා වැඩසටහන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙළඳපොල දත්ත විශ්ලේෂණය කොට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි දියුණුවට බලපාන ප්‍රධාන ගැටලු හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ඵලදායී විසඳුම් ලබාදීම.

- ආර්ථික සංවර්ධනය උදෙසා රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන සහනාධාර වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙළෙඳපොල අවශ්‍යතාවයන් අනුව, බැංකු, රක්ෂණය, සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර ව්‍යවසාය අංශය සහ මූල්‍ය අංශයන්ට අදාළ නීති බලගැන්වීම සඳහා අවශ්‍ය සහසුකම් සැලසීම.

- සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර ව්‍යවසාය අංශය, බැංකු, මූල්‍ය වෙළෙඳපොල සහ අනෙකුත් අංශයන්ට අදාළව රජයේ වාර්ෂික අයවැය සැකසීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.


- සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර ව්‍යවසාය අංශය, ප්‍රාථමික ව්‍යවසාය අංශය සහ අනෙකුත් අංශයන්ට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳව කෘෂිකාර්මික, කාර්මික, හා සේවා යන අංශ යටතේ දත්ත රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම මගින් පවතින දුෂ්කරතා හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම.

- රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රම පිළිබඳව සොයාබැලීම.

- රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් හි සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු හා මූල්‍ය පහසුකම් ලබාදීම.

## සංවිධාන ව්‍යුහය




| | |
|---|---|
| නි. අ. | - නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ස.අ. | - සහකාර අධ්‍යක්ෂ |
| සැ. ස. | - සැලසුම් සහකාර |
| ප. ස. | - පර්යේෂණ සහකාර |
| තො. ස හා තා. ස. | - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර |
| ක. ස. | - කළමනාකරණ සහකාර |
| රි.දු. | - රියදුරු |
| කා. කා. ස. | - කාර්යාල කාර්ය සහයක |

***අංශය***

| | |
|---|---|
| මූ. වෙ. ප්‍රා. අ. හා පරි. | - මූල්‍ය වෙළඳපොල, ප්‍රාථමික අංශය හා පරිපාලනය |
| ක්. මූ. | - ක්ෂුද්‍ර මූල්‍ය |
| සු. ම. ප. | - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය |
| ස. මූ. අ. ක්‍ර. සැ. | - සංවර්ධන මූල්‍ය හා ඇගයීම් පිළිබඳ ක්‍රමෝපාය සැලසුම් කිරීම |

# 2. 2015 වර්ෂයේ කාර්යය සාධනය

## 2.1 සමාලෝචනය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්, ආර්ථික වර්ධනයේ ප්‍රධාන ගාමක බලවේගයක් ලෙස සලකනු ලබන්නේ එමඟින් රැකියා උත්පාදනය, නව ව්‍යාපාර ක්‍රමවේදයන් හඳුන්වාදීම, දරිද්‍රතාවය හා උද්දමනය අවම කිරීම, සාධාරණ සංවර්ධන අවස්ථා ඇති කිරීම හා ගෙවුම් ශේෂ ගැටළු නිරාකරණය කිරීම සඳහා විශාල පිටුවහලක් වන බැවිනි. රටෙහි සමස්ත ව්‍යාපාර සංඛාවෙන් සියයට 75 ක් ද, රැකියා අවස්ථාවන්ගෙන් සියයට 45 ක් ද, හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 52 ක දායකත්වයක් ද ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, කෘෂිකාර්මික, නිෂ්පාදන හා සේවා යන සියළු අංශයන් තුළ දායකත්වය දරමින් ශ්‍රී ලංකාව තුළ සියලු අංශයන් සංවර්ධනය කිරීමෙහිලා සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම ක්ෂේත්‍රයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් ඒ සඳහා මාර්ගෝපදේශනය තුළින් අපේක්ෂිත අභිමතාර්ථ ඉටුකර ගැනීමට 2015 වසරේ දී රජය විසින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කොට ප්‍රකාශයට පත් කරන ලදී

ක්ෂුද්‍රමූල්‍ය සේවා සැපයීමේ දිගු ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය අංශය සෑම වසරක් තුළම සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් ලඟාකරගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ හා පෞද්ගලික අංශයේ වාණිජ බැංකු, සංවර්ධන බැංකු, සමූපකාර සමිති, රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වැනි ක්ෂුද්‍රමූල්‍ය සේවා සපයනු ලබන විවිධ වර්ගයේ ආයතන රාශියක් බිහි වී ඇත. රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන් කිහිපයක් ද වේ. ක්ෂුද්‍රමූල්‍ය ආයතනයන්ට තම සේවා පොදු රාමුවක් තුළ ප්‍රතිලාභීන්ට ලබාදීමට හැකි වන පරිදි ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රය නියාමණය හා අධීක්ෂණය කිරීමේ අරමුණින් සකස් කරන ලද ක්ෂුද්‍රමූල්‍යය පනත් කෙටුම් පත 2015 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

2015 වසරේ දී රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ වූ මූල්‍ය සහනාධාර වැඩසටහන් අතුරින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායිතාවය නංවාලීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් රාශියක් ගෙන ඇත. පොහොර සහනාධාර වැඩසටහනේ සිට වී මිල දී ගැනීමේ වැඩසටහන දක්වා යෙදවුම් හා නිමවුම් යන දෙවර්ගයම දිරි දීමනා ලබාදීම තුළින් ගොවීන්ගේ ලාභාන්තිකය ඉහළ නැංවීමටත්, රට තුළ ආහාර සුරක්ෂිතතාව ස්ථාපිත කිරීමටත් රජය විසින් කටයුතු කර ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වසරේ අතිරික්ත වී නිෂ්පාදනය කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය බැංකු හා මහා භාණ්ඩාගාරය හරහා මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම තුළින් රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම නිසා ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා රජය ගත් ක්‍රියාමාර්ග වඩාත් තහවුරු වේ. එසේම, වී මිල දී ගැනීම සඳහා වඩාත් විනිවිධභාවයකින් යුත් ක්‍රමවේදයක් හඳුන්වාදීම තුළින් වී අලෙවි මණ්ඩලය මෙතෙක් මිල දී ගත් වැඩිම වී ප්‍රමාණය මෙම වසරේ මිල දී ගන්නා ලදී.

මීට අමතරව, බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ සුවිශේෂී ස්ථානයක් පොහොර සහනාධාරය සඳහා හිමිව තිබේ. කෙසේ වෙතත්, පොහොර අධි භාවිතය වැනි හේතූන් නිසා පොහොර සහනාධාරයේ ඵලදායීතාව හා තිරසරභාවය සම්බන්ධයෙන් ගැටළු පැනනැගී ඇත. රසායනික පොහොර අධි භාවිතය, පස හා ජලය දූෂණය වීම හා ආහාර සුරක්ෂිතතාව කෙරෙහි සෘජුවම බලපාන අතර ඊට සමගාමීව වකුගඩු රෝග තත්ත්වයන් ද උද්ගත වී ඇත. මෙකී කරුණු සැලකිල්ලට ගෙන සමාජීය හා පාරිසරික උවදුරු මග හැරීම මගින් ඵලදායීතාව තහවුරු කරන අතරම ගොවියාට සිය කෘෂි යෙදවුම් තෝරා ගැනීමට වඩාත් නම්‍යශීලී ක්‍රමවේදයකට ඉඩ පහසුකම් සලසමින් රජය විසින් මෙතෙක් ක්‍රියාත්මක වූ පොහොර සහනාධාර ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට 2016 අයවැය මගින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී.

## 2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය

### 2.2.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති රාමුව

රැකියා උත්පාදනය, දළ දේශීය නිෂ්පාදනයට දක්වනු ලබන දායකත්වය සහ සැමට සාධාරණ සංවර්ධන අවස්ථා තහවුරු කිරීම සඳහා දක්වන දායකත්වය මත පදනම්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය, රටෙහි සමස්ත ආර්ථිකයේ ප්‍රධාන අංශය ලෙස රජය සලකනු ලබයි. මෙම අංශයට නිසි වටිනාකමක් දෙමින්, මෙම ක්ෂේත්‍රය අපේක්ෂිත අරමුණ කරා යොමු කරවීමට රජය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමට 2015 වර්ෂයේ දී ක්‍රියා කරන ලදි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවේ "දැක්ම" වනුයේ ජාතික ආර්ථික සංවර්ධනයට දායක වන ගෝලීයව තරඟකාරී, සක්‍රීය, නවෝත්පාදන, නව තාක්ෂණය හා මුසු වූ පරිසර හිතකාමී සහ අඛණ්ඩ පැවැත්මක් සහිත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් රැසක් බිහි කිරීමයී.

සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවේ "මෙහෙවර" වනුයේ උචිත පරිසරය, තාක්ෂණ හුවමාරු අංශයේ නව සොයාගැනීම්, ව්‍යවසායීය සංස්කෘතිය, කුසලතා සංවර්ධනය, මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය පහසු කිරීම, අවශ්‍ය වෙළඳපොළ පහසුකම් ලබාදීම සහ පර්යේෂණ හා සංවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙමින් දේශීයව හා ජාත්‍යන්තරව තරඟ කළ හැකි ලොව පිළිගත් මට්ටමේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිමත් කිරීමයි.

තවද, මෙම ප්‍රතිපත්ති රාමුව මඟින් දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නිර්වචනය කිරීම සඳහා පරිපූර්ණ හා අනන්‍ය වූ නිර්වචනයක් හඳුන්වා දෙන ලදි. මින් ඉදිරියට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය හා සම්බන්ධ ඕනෑම ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමේ දී ප්‍රතිපත්ති සකසන්නට මෙම නිර්වචනය යොදාගත හැක.

**වගුව 2.1 > සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා වූ නිර්වචනය**

| ප්‍රමාණය / අංශය | නිර්ණායකය | මධ්‍යම | කුඩා | ක්ෂුද්‍ර |
|---|---|---|---|---|
| නිෂ්පාදන අංශය | වාර්ෂික පිරිවැටුම | රු. මිලියන 251-750 | රු. මිලියන 16-250 | රු. මිලියන 15 ට අඩු |
| | සේවකයන් සංඛ්‍යාව | 51-300 | 11-50 | 10 ට අඩු |
| සේවා අංශය | වාර්ෂික පිරිවැටුම | රු. මිලියන 251-750 | රු. මිලියන 16-250 | රු. මිලියන 15 ට අඩු ට |
| | සේවකයන් සංඛ්‍යාව | 51-200 | 11-50 | 10 ට අඩු |

මූලාශ්‍රය :සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති රාමුව, කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

තවද, මෙම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය පිළිබඳව සකස්කරන ලද ජාතික ප්‍රතිපත්ති රාමුව මඟින් සුදුසු පරිසරය, සුදුසු නවීන තාක්ෂණය, ව්‍යවසායකත්ව පරිසරය සහ කුසලතා සංවර්ධනය, මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය, වෙළඳපොළ පහසුකම් සැපයීම සහ පර්යේෂණ සහ සංවර්ධන යන මූලික අංශ හය යටතේ ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් හා උපාය මාර්ග හඳුනාගෙන ඇත.

### 2.2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම්

සම්ප්‍රදායික බැංකුකරණ රාමුවෙන් මිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ඔවුන් යෙදී සිටින ව්‍යාපාර ක්ෂේත්‍රයෙන් මීළඟ ඉහළ තලයට ඔසවා තැබීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම වෙනුවෙන් ඔවුන් සඳහා පවත්නා මූල්‍ය පහසුකම් වැඩි කිරීමට රජය විසින් මූල්‍ය ආයතන නිරතුරුවම දිරිගන්වයි. 2015 වර්ෂය තුළ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍යමය


අවශ්‍යතාවන් සපුරාලීම සඳහා රුපියල් මිලියන 604,590 ක මුදලක් රජයේ හා පෞද්ගලික අංශයේ වාණිජ හා සංවර්ධන බැංකු විසින් ණය වශයෙන් ලබා දී ඇති අතර 2014 වර්ෂයේ දී මෙසේ ණය වශයෙන් ලබා දී ඇති මුදල රුපියල් මිලියන 521,385 කි.

**වගුව 2.2 > රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ හා සංවර්ධන බැංකු විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත ලබාදුන් ණය - 2015**

| බැංකුව | කෘෂිකර්මය | | සේවා | | කාර්මික | | අනෙකුත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ණය සංඛ්‍යාව | වටිනාක (රු.මිලියන) | ණය සංඛ්‍යාව | වටිනාකම (රු.මිලියන) | ණය සංඛ්‍යාව | වටිනාකම (රු.මිලියන) | ණය සංඛ්‍යාව | වටිනාකම (රු.මිලියන) | ණය සංඛ්‍යාව | වටිනාකම (රු.මිලියන) |
| ලංකා බැංකුව | 937 | 3,485.00 | 286 | 877.00 | 639 | 2,230.00 | 26,724 | 59,311.00 | 28,586 | 65,903.00 |
| මහජන බැංකුව | 340 | 529.55 | 396 | 1,227.40 | 274 | 1,029.18 | 603 | 1,206.85 | 1,613 | 3,992.98 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 1,176 | 754.00 | 89 | 57.00 | 1,321 | 831.00 | 25,655 | 18,809.00 | 28,241 | 20,451.00 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 24 | 76.90 | 33 | 106.04 | 143 | 728.67 | 10 | 33.50 | 210 | 945.11 |
| සණස සංවර්ධන බැංකුව | 358 | 234.35 | 17 | 10.85 | 11 | 16.54 | 1,029 | 736.82 | 1,415 | 998.55 |
| ජාතික සංවර්ධන බැංකුව | 1,898 | 3,446.52 | 449 | 2,117.35 | 12,983 | 18,444.77 | 1,186 | 1,931.56 | 16,516 | 25,940.20 |
| ඩී එෆ් සී සී බැංකුව | 538 | 4,924.23 | 3,415 | 15,654.73 | 1,872 | 13,085.27 | 2,006 | 4,331.50 | 7,831 | 37,995.73 |
| කොමර්ෂල් බැංකුව | 3,412 | 14,247.89 | 10,891 | 54,938.92 | 11,677 | 81,987.62 | 19,742 | 109,233.20 | 45,722 | 260,407.63 |
| සම්පත් බැංකුව පීඑල් සී | 385 | 2,400.00 | 850 | 8,162.00 | 962 | 5,653.00 | 2,907 | 15,611.00 | 5,104 | 31,826.00 |
| සෙලාන් බැංකුව | 30 | 2,225.39 | 35 | 1,774.15 | 60 | 3,332.16 | 91 | 12,467.42 | 216 | 19,799.12 |
| හැටන් නැෂනල් බැංකුව | 6,754 | 10,499 | 15,625 | 63,929 | 4,391 | 17,521 | 1,820 | 5,184 | 28,590 | 97,133 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 240 | 1,880.09 | 1,984 | 7,497.56 | 316 | 1,207.15 | 7,079 | 10,938.93 | 9,619 | 21,523.73 |
| ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව | 1 | 55.00 | 34 | 500.00 | 58 | 581.00 | 1 | 1.00 | 94 | 1,137.00 |
| යූනියන් බැංකුව | 186 | 1,166.67 | 616 | 2,441.18 | 1,539 | 3,139.73 | 2,976 | 9,789.40 | 5,317 | 16,536.98 |
| **එකතුව** | **16,279** | **45,924.59** | **34,720** | **159,293.18** | **36,246** | **149,787.09** | **91,829** | **249,585.18** | **179,074** | **604,590.03** |

*මූලාශ්‍රය : ‍අදාළ බැංකු*

2015 වර්ෂය තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ හා සංවර්ධන බැංකු විසින් ප්‍රදානය කරන ලද සමස්ත ණය සංඛ්‍යාවෙන් සියයට 9 ක් කෘෂිකාර්මික අංශයටත් සියයට 20 ක් කාර්මික අංශයටත් සියයට 19 ක් සේවා අංශයටත් ලබා දී ඇති අතර 2014 වර්ෂයේ දී මෙම අගයන් පිළිවෙලින් සියයට 12 ක්, සියයට 15 ක් සහ සියයට 25 ක් විය. තවද, 2015 වර්ෂයේ දී මෙම සමස්ත ණය සංඛ්‍යාවෙන් සියයට 51 ක් අනෙකුත් ක්ෂේත්‍ර අතර බෙදී ගොස් ඇති අතර 2014 වර්ෂයේ දී එම අගය සියයට 49 ක් විය.




## 2.3 ක්ෂුද්‍රමූල්‍යනය

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය අංශයේ සැලකියයුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. විවිධ ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් සපයන මූල්‍යමය සේවාවන් සමාජයේ අවශ්‍යතා ඇති සියලුම පාර්ශවයන්ට ලබාගත හැකි වන පරිදි ව්‍යාප්ත වී ඇති අතර ඇප සුරැකුම් රහිතව හෝ සුළු ඇප සුරැකුම් සහිතව ණය ලබාදිය හැකි පරිදි නව ක්‍රමෝපායන් වර්ධනය වී ඇත. ඉතුරුම්, ක්ෂුද්‍ර ණය, ක්ෂුද්‍ර රක්ෂණය හා මූල්‍යමය හුවමාරුවීම් යන ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් යටතේ සිදුකරන ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් කුටුම්භයන්ගේ ආදායම, පාරිභෝජන මට්ටම, වත්කම්හි අගය වැඩි කිරීමේ ලා සුවිශේෂ දායකත්වයක් ලබා දී ඇත. තවද, ක්ෂුද්‍ර මූල්‍යයනය මගින් අඩු ආදායම් ලාභීන් ඉතිරි කිරීම් සඳහා දිරිමත් කරමින් ඔවුනගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් ප්‍රවර්ධනයට ද දායක වී ඇත.

2015 වර්ෂයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ජාතික ප්‍රතිපත්ති රාමුව ප්‍රකාශයට පත් කළ අතර එහි දී ක්ෂුද්‍රමූල්‍ය අංශය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කර ඇත. ඒ අනුව, සේවා නියුක්තිය 10 කට අඩු වූ හා රුපියල් මිලියන 15 ට අඩු වාර්ෂික පිරිවැටුමක් සහිත නිෂ්පාදන හා සේවා අංශවල සියළුම ව්‍යවසායන් ක්ෂුද්‍රමූල්‍ය කාණ්ඩයට ඇතුලත් කරන ලදි.

2015 වර්ෂයේ දී ක්ෂුද්‍රමූල්‍ය නියාමන පනත පාර්ලිමේන්තුවේ සභාගත විය. ජාතික අරමුණු සමඟ එකඟත්වයක් පවත්වා ගැනීමේ අරමුණ ඇතිව මුදල් මණ්ඩලය විසින් ලබාදෙන මාර්ගෝපදේශ හා ජාතික නියාමන ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රධාන නියාමන ස්ථර 4 ක් යටතේ මෙම පනත ක්‍රියාත්මක වේ. ඒ අනුව, විශාල ප්‍රමාණයක් වූ ක්ෂුද්‍රමූල්‍ය ආයතන සංඛ්‍යාවක් එම ආයතනයේ ක්‍රියාකාරීත්වය හා ආයතන ව්‍යුහය පදනම් කරගෙන ප්‍රධාන කාණ්ඩ 4 කට වර්ග කර ඇති අතර මෙම අංශයේ ක්‍රියාකාරකම් විධිමත්ව පවත්වාගැනීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය අධිකාරිය ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.


2015 වර්ෂයේ දී මෙම අංශයේ සිදු වූ නව ජයග්‍රහනයන් සමඟ රජයේ ප්‍රමුඛ කාර්ය භාරය තවදුරටත් ශක්තිමත් වී ඇත. අඩු ආදායම්ලාභී පවුල් කේන්ද්‍ර කර ගත් රජය විසින් දියත් කළ විවිධ ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන් 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදි.

වගුව 2.3 > ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ප්‍රගතිය - 2015

| ක්ෂුද්‍රමූල්‍ය ආයතනය | ශාඛා සංඛ්‍යාව | තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව | ණය ලාභීන්ගේ සංඛ්‍යාව | මුළු තැන්පතු ප්‍රමාණය (රු.මි.) | මුළු ආයෝජනය (රු.මි.) | මුළු ණය ප්‍රමාණය (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| දිවිනැගුම දෙපාර්තමේන්තුව | 1,074 | 4,234,029 | 1,599,058 | 65,034 | 63,522 | 38,320 |
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 2,210 | 9,631,080 | 569,376 | 94,685 | 97,747 | 39,406 |
| ගොවිජනසේවා දෙපාර්තමේන්තුව | 534 | 253,370 | 62,009 | 350 | 6,748 | 976 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 265 | 5,676,619 | 839,664 | 86,340 | 16,076 | 41,276 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 8 | 56,145 | 8,555 | 500 | 5,506 | 3,371 |
| **එකතුව** | **4,091** | **19,851,243** | **3,078,662** | **246,909** | **189,599** | **123,349** |

*මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව*

රජයේ ප්‍රමුඛ ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් සැලකියයුතු මට්ටමේ ක්ෂුද්‍ර ණය ප්‍රමාණයක් රට තුළ මූල්‍යමය අවශ්‍යතාවයන් ඇති පුද්ගලයන් වෙත ප්‍රදානය කර ඇත. 2015 වසර අවසානය වන විට ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයට ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 123 ඉක්මවයි. එය දිවි නැගුම දෙපාර්තමේන්තුව සියයට 31 ක් ද (රුපියල් බිලියන 38) සමූපකාර දෙපාර්තමේන්තුව සියයට 32 ක් ද (රුපියල් බිලියන 39) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සියයට 33 ක් ද (රුපියල් බිලියන 41) ක් ද ලෙස වේ. 2015 වසර අග වන විට දිළිඳු ජනතාවගේ අනිවාර්ය ඉතුරුම් රුපියල් බිලියන 217 දක්වා ළඟා වී ඇති අතර ඉන් රුපියල් බිලියන 156 ක් දිගු කාලීන හා කෙටි කාලීන ආයෝජනයන්හි යොදවා ඇත.



රූපසටහන 2.2 > ප්‍රධාන බැංකු විසින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ලබා දී ඇති ණය ප්‍රමාණය

2015 වසරේ දී වාණිජ බැංකු විසින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ලබා දී ඇති මුළු මුදල රුපියල් බිලියන 165 ක් වන අතර ඉන් රුපියල් බිලියන 101 ක් ලංකා බැංකුව විසින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර), දිළිඳු බව තුරන් කිරීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘතිය හා "සෞභාග්‍යා" යන ණය යෝජනා ක්‍රම හරහා සුළු පරිමාණ ණය ලෙස ලබා දී ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා මහජන බැංකුව 2015 වසර තුළ පිළිවලින් රුපියල් බිලියන 50 ක් සහ රුපියල් බිලියන 10 ක් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ණය ලෙස ප්‍රදානය කර ඇත. රජයේ බැංකුවලට සාපේක්ෂව පෞද්ගලික

බැංකු වන සෙලාන් බැංකුව හා හැටන් නැෂනල් බැංකුව විසින් ද සැලකිය යුතු ණය ප්‍රමාණයක් ග්‍රාමීය ප්‍රදේශවල ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇත.


## 12.4 කෘෂිකාර්මික ක්ෂේත්‍රය නගා සිටුවීම

### 12.4.1 ගොවීන්ගේ ඵලදායීතාවය නංවාලීම සඳහා වන පොහොර සහනාධාරය

පොහොර සහනාධාරය යනු කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායීතාවය නංවාලීම සඳහා වන ප්‍රධාන සුභසාධන වැඩසටහනකි. දැනට ක්‍රියාත්මක පොහොර සහනාධාරය මඟින් වී ඇතුළු අනෙකුත් බෝග සඳහා සහනදායී මිල ගණන් යටතේ පොහොර මිල දී ගැනීමට අවස්ථාව සලසා දී ඇති බැවින් ගොවීන්ට තම නිෂ්පාදන පිරිවැය අවම කරගැනීමට හැකියාව ලැබී ඇත.

පොහොර සහනාධාර වැඩසටහන සඳහා 2015 වසරේ දී දරා ඇති මුළු වියදම රුපියල් මිලියන 49,570 ක් පමණ වූ අතර එය 2014 වසරේ වියදම වූ රුපියල් මිලියන 31,802 සමග සැසඳීමේ දී සියයට 56 ක වර්ධනයකි. ඒ අනුව, 2015 වසර මේ දක්වා පොහොර සහනාධාරය සඳහා වැඩිම වියදමක් දරා ඇති වසර ලෙස සැලකේ. මෙසේ 2015 වසරේ දී වියදම වැඩිවීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ මින් පෙර වසරවල දී පොහොර සහනාධාරය වෙනුවෙන් ගෙවීමට තිබූ හිඟ මුදල් පියවීමයි. 2015 වසරේ දී පොහොර සහනාධාරය සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන තුළින් සියයට 99 ක් පමණ මෙම වසරේ දී උපයෝජනය කොට ඇත.

රූපසටහන 2.3 > වාර්ෂික පොහොර සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයට සාපේක්ෂව ඒ සඳහා දරා ඇති වියදම ප්‍රතිශතයක් ලෙස (රු.මි.)




#### 12.4.1.1 වී වගාව සඳහා වන පොහොර සහනාධාරය

2005 වසරේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහන යටතේ, වී වගාව සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන සෘජු පොහොර වර්ග තුනෙහි කිලෝ ග්‍රෑම් 50 මිටියක් රුපියල් 350/- ක සහනාධාර මිලකට ලබා ගැනීමට ගොවියාට ඉඩ ප්‍රස්ථා ලබා දී ඇත. ඒ අනුව, යූරියා, ටී. එස්. පී. (ට්‍රිපල් සුපර් පොස්ෆේට්) හා එම්. ඕ. පී. (මියුරියේට් ඔෆ් පොටෑෂ්) යන පොහොර වර්ග ගොවිජන සේවා

මධ්‍යස්ථාන හරහා දීප ව්‍යාප්ත බෙදා හැරීමේ ජාලය තුළින් නිකුත් කරනු ලැබේ. වී පොහොර බෙදාහැරීමේ කාර්යභාරය රජයේ පොහොර සමාගම් දෙක හරහා මුළුමනින්ම සිදු කර ඇත.

කිලෝ ග්‍රෑම් 50 වී පොහොර මිටියක් සඳහා රජය විසින් දරනු ලබන සහනාධාර වටිනාකමේ ප්‍රතිශතය වෙළෙඳපොළ මිලට සාපේක්ෂව සාමාන්‍යයෙන් සියයට 88 ක් පමණ වේ.

රූපසටහන 2.4 > වී සඳහා වන පොහොර සහනාධාරය - 2015




2015 වසර මේ දක්වා වැඩිම වී නිෂ්පාදනයක් ලබාදුන් වර්ෂය ලෙස වාර්තා වේ. මෙතෙක් වැඩිම වී නිෂ්පාදනය වාර්තා වූ වර්ෂයන් හා සසඳන විට පොහොර සහනාධාරය ලබාගත් ගොවීන් සංඛ්‍යාව මෙන්ම නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයන් ද අඩු වී ඇති අතර වගා කළ බිම් ප්‍රමාණය හා වී නිෂ්පාදනය වැඩි වී ඇත. 2013 වසරේ සිට 2015 දක්වා වී වගාවේ සාමාන්‍ය ඵලදායීතාවය සියයට 2.3 කින් වැඩි වී ඇති අතර එය 2010 සිට 2013 දක්වා සියයට 4.4 කින් අඩු වී ඇත.

**වගුව 2.4 > වී වගාවේ වැඩි අස්වනු වාර්තා වූ වර්ෂයන් සඳහා තොරතුරු සංසන්දනය**

| විස්තරය | සහනාධාර පොහොර ලබාගත් ගොවීන් සංඛ්‍යාව | නිකුත් කළ පොහොර ප්‍රමාණය (මෙ. ටො.) | අස්වනු නෙලාගත් ශුද්ධ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | වී නිෂ්පාදනය (මෙ. ටො.) | වී වගාවේ සාමාන්‍ය ඵලදායීතාව (හෙක්ටයාරයකට මෙ.ටො.) |
|---|---|---|---|---|---|
| 2009/10 මහ | 1,100,543 | 263,512 | 573,788 | 2,629,566 | 4.6 |
| 2010 යල | 785,966 | 186,556 | 376,024 | 1,671,054 | 4.4 |
| **2010 එකතුව** | **1,886,509** | **450,068** | **949,812** | **4,300,620** | **4.5** |
| 2012/13 මහ | 1,044,343 | 247,078 | 664,804 | 2,846,276 | 4.3 |
| 2013 යල | 658,560 | 113,434 | 402,534 | 1,774,452 | 4.4 |
| **2013 එකතුව** | **1,702,903** | **360,512** | **1,067,338** | **4,620,728** | **4.3** |
| 2014/15 මහ | 998,710 | 197,305 | 659,283 | 2,876,987 | 4.4 |
| 2015 යල | 663,106 | 89,915 | 429,091 | 1,942,408 | 4.5 |
| **2015 එකතුව** | **1,661,816** | **287,220** | **1,088,374** | **4,819,395** | **4.4** |

*මූලාශ්‍රය : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

මේ වන විට රසායනික පොහොර භාවිතය හා ඵලදායීතාවය අතර සැළකිය යුතු අන්දමේ සහසම්බන්ධතාවක් නොමැති බව බොහෝ පර්යේෂකයින් විසින් පෙන්වා දී ඇත. දැනට


ක්‍රියාත්මක පොහොර සහනාධාර වැඩසටහන හේතුවෙන් විශාල පොහොර ප්‍රමාණයක් රට තුළට ආනයනය කරනු ලබන අතර පොහොර අධි භාවිතය හා අනිසි භාවිතය හේතුවෙන් සෞඛ්‍යමය හා පාරිසරිකමය ගැටළු රාශියකට මුහුණ පෑමට සිදු වී ඇත.

### 2.4.1.2 අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාරය

2011 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාරය පහත සඳහන් සහනදායී මිල ගණන් යටතේ ක්‍රියාත්මක විය.

- කිලෝ ග්‍රෑම් 50 ඕනෑම වර්ගයක සෘජු පොහොර මිටියක් රුපියල් 1,200/- ක සහනදායී මිලකට සැපයීම.
- කිලෝ ග්‍රෑම් 50 ඕනෑම වර්ගයක මිශ්‍ර පොහොර මිටියක් රුපියල් 1,300/- ක සහනදායී මිලකට සැපයීම.

මෙම සහනාධාරය යටතේ ගොවීන්ට තමන්ගේ වගා ධාරිතාවය එක් බෝගයක සිට බහුවිධ බෝගයන් දක්වා ව්‍යාප්ත කිරීමටත්, වී හැර අනෙකුත් වගාවන්හි ඵලදායීතාවය නංවාලීමටත් ඉඩ ප්‍රස්ථා සලසා දී ඇත. මෙම සහනාධාරය යටතේ කිලෝ ග්‍රෑම් 50 සෘජු පොහොර මිටියක් සඳහා වෙළෙඳපොල මිලට සාපේක්ෂව රජය විසින් දරනු ලබන සහනාධාර මුදල සියයට 28 ත් සියයට 80 ත් අතර වේ.




රජයේ පොහොර සමාගම් අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාරය යටතේ සියයට 40 ක පමණ ඉල්ලුමක් සපුරාලන අතර පෞද්ගලික අංශයේ සමාගම් මගින් ඉතිරි සියයට 60 ක පොහොර ඉල්ලුම සපුරාලන ලදී.


2015 වසරේ දී අනෙකුත් බෝග සඳහා පොහොර සහනාධාරය වශයෙන් රුපියල් මිලියන 16,889 ක පමණ මුදලක් රජය විසින් වැය කළ යුතු වූ අතර එය 2014 වසරේ දරන ලද රුපියල් මිලියන 15,020 ක වටිනාකමට සාපේක්ෂව සියයට 12 ක පමණ වර්ධනයකි. ඒ අනුව, 2015 වසර පොහොර සහනාධාරය සඳහා වැඩිම වියදමක් දැරීමට සිදු වූ වසරක් ලෙස සැලකේ.

| වගුව 2.5 > අනෙකුත් බෝග සඳහා පොහොර බෙදාහැරීමේ ප්‍රගතිය | | |
|---|---|---|
| වසර | බෙදන ලද පොහොර ප්‍රමාණය (මෙ. ටො.) | සහනාධාර වශයෙන් රජය වැය කළ මුදල (රු.මි.) |
| 2008 | 170,020 | 2,067 |
| 2009 | 232,668 | 3,817 |
| 2010 | 281,679 | 7,096 |
| 2011 | 335,323 | 9,706 |
| 2012 | 380,829 | 11,564 |
| 2013 | 379,866 | 13,800 |
| 2014 | 407,439 | 15,020 |
| 2015 | 463,672 | 16,889 |

*මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව*

2015 වසරේ දී අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාරය යටතේ පොහොර මෙ. ටො. 463,672 ක් පමණ නිකුත් කර ඇති අතර ඉන් පොහොර මෙ. ටො. 390,549 ක් පමණ අනෙකුත් බෝග සඳහා භාවිතා කර ඇත.

රූපසටහන 2.6 > වී අනෙකුත් බෝග සඳහා පොහොර භාවිතය - 2015 (මෙ. ටො.)




## 2.4.1.3 පොහොර සඳහා මුදල් සහනාධාර වැඩසටහන

කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා වන විවිධාකාරයේ දිරි දීමනාවන් හා දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකාර්මික අංශයෙන් වන දායකත්වය සැළකිල්ලට ගැනීමේ දී මෙකී දිරි දීමනාවන්ගෙන් මැදිකාලීනව අපේක්ෂිත වර්ධන ඉලක්කයන් ලඟාකර ගැනීමට අපොහොසත් වී ඇති බව රජය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, පොහොර සහනාධාර වැඩසටහන යටතේ ඉතා ඉහළ සහනාධාර මිලක් යටතේ පොහොර සැපයීම මඟින් පොහොර අධි භාවිතය හා අනිසි භාවිතය සඳහා යොමුවීම තුළ එය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයක් බවට පත්ව ඇත. මීට අමතරව, ප්‍රධාන වශයෙන් වී වගාකරන ප්‍රදේශයන්හි වකුගඩු රෝගය වැනි සෞඛ්‍යමය

ගැටළු ද, ජලය සහ පස දූෂණය වීම වැනි පාරිසරික අවධානම් තත්ත්වයන් ද උද්ගත වී ඇත. එබැවින්, රජය විසින් පොහොර සහනාධාර ප්‍රතිපත්තිය නැවත වතාවක් සංශෝධනය කිරීම සඳහා තීරණය කොට ඇති අතර එමඟින් සමාජීය හා පාරිසරික උවදුරු අවම කර ගැනීමටත් ගොවියාට තමාගේ කෘෂි යෙදවුම් වඩාත් නම්‍යශීලීව තෝරාගෙන ඵලදායීතාව වර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීමටත් අපේක්ෂා කෙරේ.

2016 අයවැය මඟින්, පොහොර සහනාධාරය වෙනුවට වී ගොවියෙකු හට වසරකට හෙක්ටයාරයකට රුපියල් 25,000/- ක උපරිමයකට යටත්ව හෙක්ටයාර් දෙකක් දක්වා පොහොර මිල දී ගැනීම සඳහා මුදල් සහනාධාරයක් පිරිනැමීමට යෝජනා වී ඇත. ඒ අනුව, හෙක්ටයාර් දෙකක් හිමි කුඩා පරිමාණ වී ගොවියෙකු හට වසරකට රුපියල් 50,000/- ක මූල්‍යමය සහනාධාරයක් හිමි වේ. මෙමඟින් ගොවීන් හට තමාට ලැබෙන මුදල් සහනාධාරය රසායනික පොහොර හෝ කාබනික පොහොර වෙනුවෙන් වියදම් කිරීමට අවස්ථාව සැලසෙන අතරම විවෘත වෙළෙඳපොල මිල ගණන් යටතේ ඕනෑම පොහොර වර්ගයක් වෙළෙඳපොලින් මිල දී ගත හැක.

## 2.4.2 නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

ගොවීන්, කෘෂි නිෂ්පාදන මිල දී ගන්නන් හා කෘෂිකර්මය මත පදනම් වූ නිෂ්පාදකයින් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනවල හරහා ක්‍රියාත්මක වූ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ බැංකු විසින් ස්වකීය අරමුදල් යොදාගනිමින් සහනදායි පොළී අනුපාතයක් යටතේ ප්‍රදානය කරනු ලැබූ ණය සඳහා පොළී සහනාධාර ලබාදීම රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන වගා ණයවලින් බහුතරයක් උපයෝජනය කරනු ලබන්නේ සුළු පරිමාණ ගොවීන්ය. ග්‍රාමීය අංශයේ නිෂ්පාදනය දිරි ගන්වමින් හා එම ජනතාවගේ දිළිඳුකම පිටුදැකීම තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය මහඟු පිටුවහලක් වී ඇත. වගා කටයුතු සඳහා ගොවීන්ට සියයට 7 ක පොළී අනුපාතයකට ණය ලබාදෙන අතර ඒ සඳහා සියයට 5 ක වාර්ෂික පොළී සහනාධාරයක් ද රජය විසින් ලබා දේ. වී, මිරිස්, බඩ ඉරිඟු, ලොකු ලූනු, අර්තාපල්, එළවලු, ද ඇතුලත්ව අනෙකුත් බෝග වගා 33 ක් සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙනු ලැබේ.

මෙතෙක් ණය ලබාදුන් සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ට අමතරව 2015 වසරේ දී නිවාස සංවර්ධන මූල්‍ය ස්ංස්ථාව ද මෙම ණය යෝජනා ක්‍රමයට එක් වී ඇති අතර ඒ අනුව, මුළු සහභාගීත්ව ආයතන සංඛ්‍යාව දහය දක්වා වැඩි වී ඇත. මහා භාණ්ඩාගාරය විසින් 2015 වසර තුළ රුපියල් මිලියන 276 ක් පොළී සහනාධාර ලෙස ණය ලබාදෙන බැංකු වෙත නිදහස් කර ඇත.

සුළු පරිමාණ ගොවීන්ගේ නිෂ්පාදන සඳහා කෙටිකාලීන ණය ලබාදීමේ අරමුණින් ආරම්භ කරන ලද ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය 2015 ජුලි 6 වන දින සිට මෙම ණය යෝජනා ක්‍රමයට ඇතුලත් කරන ලදි. ඒ අනුව, ගබඩාවල තම නිෂ්පාදන තැන්පත් කර කෙටි කාලීන වගා ණය ලබා ගැනීමට අපේක්ෂා කරන සුළු පරිමාණ ගොවීන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගැනීමට සුදුසුකම් ලබති. මෙහිදී කුවිතාන්සිය බැංකුවේ සුරැකුමක් ලෙස රඳවාගෙන ණය මුදල් නිකුත් කරනු ලබයි. ගබඩා කරනු ලබන නිෂ්පාදනයන්ගේ වෙළඳපොල වටිනාකමින් සියයට 50 ක ණය මුදලක් ණය ආපසු ගෙවීමේ කාලය දින 270 ක උපරිමයකට යටත්ව මෙම යෝජනා ක්‍රමය යටතේ ගොවීන්ට ලබාගත හැක.


**වගුව 2.6 > 2015 වසරේ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය**

| බෝගය | උපරිම ණය සීමාව (රු.) | උපරිම භූමි ප්‍රමාණය (අක්කර) | ලබාදුන් ණය ප්‍රමාණය | ප්‍රදානය කළ ණය මුදල (රු.මි.) | භූමි වපසරිය (අක්කර) |
|---|---|---|---|---|---|
| වී - වාරිමාර්ග | 250,000, | 10 | 62,742 | | |
| වර්ෂා පෝෂිත | 150,000 | 10 | | 4,738 | 214,011 |
| බඩ ඉරිඟු | 250,000 | 10 | 10,995 | 632 | 27,946 |
| අර්තාපල් | 350,000 | 2 | 3,634 | 524 | 3,938 |
| ලූනු | 190,000 | 2 | 7,582 | 881 | 11,339 |
| මිරිස් | 130,000 | 2 | 2,380 | 136 | 3,148 |
| එළවළු | 40,000 - 180,000 | 2 | 1,881 | 154 | 2,723 |
| වෙනත් - ඉඟුරු | 140,000 | 2 | 1,319 | 71 | 2,615 |
| **එකතුව** | | | **90,533** | **7,138** | **265,720** |


*මූලාශ්‍රය : ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව*

රට තුළ පැවති යහපත් ආර්ථික තත්ත්වය හා දේශගුණික පරිසරය හේතුවෙන් 2015 වසර තුළ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ණය සඳහා ඉල්ලුම වැඩි වීමට හේතු විය. ඒ අනුව, 2014 වසර හා සැසඳීමේ දී 2015 වසරේ ද ප්‍රතිලාභීන් සංඛ්‍යාව 86,143 සිට 90,533 දක්වා වර්ධනය වී ඇති අතර මුළු ප්‍රදානිත ණය ප්‍රමාණය රුපියල් මිලියන 6,749 සිට රුපියල් මිලියන 7,138 දක්වා වැඩි වී ඇත. ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණය අනුව රුපියල් 250,000/- ක උපරිමයකට යටත්ව වී වගාකරුවන්ට වැඩිම ණය ප්‍රමාණයක් නිදහස් කර ඇති අතර එය 2015 වසර තුළ ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 69 කි. 2015 වසර තුළ මෙම ණය පහසුකම් යටතේ අක්කර 265,719 ක් කෘෂි බෝග වගා කර ඇති අතර ඉන් සියයට 80 ක් පමණ වී වගාව සඳහා යොදාගෙන ඇත.

රූපසටහන 2.7 > නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක අනුව ප්‍රදානිත ණය ප්‍රමාණය - 2015



2015 වසර තුළ ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය හා ප්‍රතිලාභීන්ගේ ප්‍රාදේශීය ව්‍යාප්තිය සැලකීමේ දී මුළු ණය ප්‍රමාණය වන රුපියල් මිලියන 7,138 න් සියයට 19 ක ප්‍රමාණය වන රුපියල් මිලියන 1,363 ක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එමෙන්ම, අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව බලන කළ පොලොන්නරුව, හම්බන්තොට, බදුල්ල සහ මාතලේ යන දිස්ත්‍රික්කවල ද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාවේ ඉහළ අගයක් පෙන්නුම් කරයි.



රූපසටහන 2.8 > බෝග ව්‍යාප්තිය අනුව නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය - 2014/15

බෝග ව්‍යාප්තිය අනුව සලකා බලන කළ 2015 වසරේ වැඩිම ණය ප්‍රමාණයක් වී වගාව සඳහා ලබා දී ඇති අතර එය සියයට 69 ක් වේ. ආනයන ආදේශන බෝග ලෙස බඩ ඉරිඟු හා ලොකු ලූනු වගාවන් සඳහා ද පිළිවලින් වී වගාවට පසුව ඉහළ ණය ප්‍රමාණයක් ප්‍රදානය කර ඇත.

## 2.4.3 වගා ණය සඳහා සහන

කෘෂිකර්මය මත පදනම් වූ ආර්ථිකයක් සඳහා ගොවීන්ගේ කාර්යභාරය සුවිශේෂත්වයක් උසුලයි. එසේ වූවත්, පසුගිය කාල වකවානුවේ ගං වතුර, නියඟ, වසංගත, ස්වභාවික ව්‍යසන, සිවිල් කෝලාහල යනාදී පාලනය කළ නොහැකි සාධක හේතුවෙන් වගා පාළුවීම නිසා ගොවීන්ට විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගොවීන් විසින් ලබාගත් බැංකු ණය නැවත ගෙවීමට නොහැකි විය. ගොවීන් මුහුණදුන් මෙම දුෂ්කරතා අවම කිරීමේ අරමුණින් ඔවුන් විසින් රජයේ බැංකුවලින් ලබාගත් වගා ණයවලින් සියයට 50 ක් කපාහැරීමට 2015 අතුරු අයවැය මඟින් යෝජනා කරන ලදි.


වී ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම සඳහා කිසියම් වගා ණය යෝජනා ක්‍රමයක් යටතේ ණය ලබාගෙන නියමිත පරිදි නොගෙවීම නිසා අක්‍රීය ගණයට මාරුකර ඇති ණය සඳහා එක් ණය ලාභියෙකුට රුපියල් 100,000/- ක උපරිමයකට යටත්ව මෙම වගා ණය කපාහැරීමේ වැඩසටහන යටතේ සහන හිමි වේ. අදාළ බැංකු විසින් අක්‍රීය මට්ටමේ පවතින ණය ශේෂවලින් සියයට පනහක් කපා හරින ලද අතර ඒ වෙනුවෙන් බැංකුවට දැරීමට සිදුවන පාඩුව මහා භාණ්ඩාගාරය විසින් අදාළ බැංකු වෙත ප්‍රතිපූර්ණය කරනු ලබයි.

**වගුව 2.7 > ගොවීන් විසින් රාජ්‍ය බැංකු මඟින් ලබාගත් වගා ණය සඳහා සහන**

| බැංකුවේ නම | ණය ප්‍රමාණය | කපාහරින ලද ණය මුදල (රු. මිලියන) |
|---|---:|---:|
| මහජන බැංකුව | 25,540 | 234.65 |
| ලංකා බැංකුව | 21,918 | 374.02 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 9,506 | 176.06 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 100 | 1.9 |
| **එකතුව** | **57,064** | **786.63** |

*මූලාශ්‍රය :* සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

රාජ්‍ය බැංකු මඟින් වගා ණය ලබාගත් ගොවීන් 57,064 දෙනෙක් සඳහා මෙම සහන වැඩසටහන යටතේ සහන ලබාදුන් අතර රජය විසින් ඒ වෙනුවෙන් රුපියල් මිලියන 786 ක මුදලක් පොළී සහනාධාර ලෙස වැයකර ඇත. රජය විසින් කපාහරින ලද මුළු වගා ණය මුදලින් සියයට 48 ක් (රුපියල් මිලියන 374) වූ මුදල ලංකා බැංකුව වෙත ප්‍රතිපූර්ණය කරන ලදි. තවද, පිළිවෙලින් රුපියල් මිලියන 234 ක් හා රුපියල් මිලියන 176 ක් මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලබාදෙන ලදි.



රූපසටහන 2.9 > ගොවීන් විසින් රාජ්‍ය බැංකු මඟින් ලබාගත් වගා ණය සඳහා සහන

මෙම සහන බෙදීගිය ආකාරය අනුව වැඩිම ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් පොලොන්නරුව (18,859), අනුරාධපුර (11,851) හා හම්බන්තොට (4,645) දිස්ත්‍රික්කවලින් වාර්තා විය. මුළු ප්‍රතිපූර්ණය කරන ලද මුදලින් සියයට පනහක්ම වී වගාකරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් අතරේ බෙදීයන ලදි.

## 2.4.4 ගොවීන් සඳහා වූ වගා රක්ෂණ ක්‍රමය

නියඟ, ගංවතුර හා වන අලින්ගෙන් සිදුවන වගා හානි සඳහා සහන සැලසීමේ අරමුණින් " කෙතට අරුණ පොහොර දිරිය වගා රක්ෂණ යෝජනා ක්‍රමය" ආරම්භ කරන ලදි. මෙම යෝජනා ක්‍රමය, ආරම්භයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල හරහා ක්‍රියාත්මක විය. තවද, වී ගොවීන්ට පමණක් සීමා වූ මෙම වගා රක්ෂණ ක්‍රමය අනෙකුත් බෝග වගාවේ නිරත කුඩා පරිමාණ ගොවීන්ට ද සහන සැළසීම දක්වා 2014 වර්ෂයේ දී පුළුල් කරන ලද අතර ගෙවීම් කටයුතුවල දී සිදු වූ අනවශ්‍ය ප්‍රමාදයන් වැලැක්වීම පිණිස 2014 දෙසැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මෙම වගා රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය පත් කරන ලදි. 2015 වර්ෂය තුළ දී දළ වශයෙන් රුපියල් මිලියන 1,006 ක මුදලක් රක්ෂණ වාරික වශයෙන් අය කරනු ලැබූ අතර වගා හානි වශයෙන් රුපියල් මිලියන 1,038 ක මුදලක් ගොවීන් 138,062 දෙනෙකුට ලබා දී ඇත.

## 2.4.5 ගොවීන් සඳහා වූ සමාජ ආරක්ෂණය

තම තරුණ අවධිය රටෙහි කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දියුණුව සඳහා වැය කළ වැඩිහිටි ගොවීන්ට ඉහළ ප්‍රතිලාභ අත්කර දීමට ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය සමත් විය. 2015 වර්ෂය අවසාන වන විට වැඩිහිටි ගොවීන් 136,421 ක් දෙනෙක් මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබූ අතර ඔවුන්ට රුපියල් මිලියන 2,481.5 ක මුදලක් විශ්‍රාම වැටුප් ලෙස 2015 වර්ෂය තුළ දී ලබා දී ඇත. මෙම ගොවි විශ්‍රාම වැටුප් අරමුදල සතුව ස්වාධීනව ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොවූ බැවින් ගොවි විශ්‍රාම වැටුප් නිසි කලට ලබාදීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් මාසිකව රුපියල් මිලියන 180 ක මුදලක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබාදෙන ලදි. මේ වන විට මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට සුදුසුකම් ලැබූ ගොවීන් සෑම මසකම පළමු සතිය තුළ දී තැපැල් කාර්යාලය හරහා තම විශ්‍රාම වැටුප ලබා ගනී.

## 2.4.6 වැවිලි කර්මාන්ත අංශය සඳහා දිරි ගැන්වීම්

විදේශ විනිමය ඉපයීමේ දී විශාල කාර්යභාරයක් ඉටු කරන වැවිලි කර්මාන්ත අංශය වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක වීම රටේ ආර්ථිකයට ඉතා වැදගත් වේ. 2015 වසර තුළ ද මෙම අංශයට දිරි දීමනා සහ සහනාධාර වැඩි වශයෙන් ලබාදීමට රජය කටයුතු කර ඇත.

මෙරට දළ දේශීය නිෂ්පදිතයෙන් සියයට 1.9 කට හා සමස්ත අපනයනයන්ගෙන් සියයට 17.5 ක ට වැවිලි කර්මාන්ත අංශය දායකත්වයක් දක්වයි. වර්තමානයේ දී වැවිලි කර්මාන්ත අංශය කෙරෙහි වැඩි දායකත්වයක් සපයනුයේ කුඩා පරිමාණයේ වැවිලිකරුවන් වන අතර අක්කර 10 ට අඩු තේ හා රබර් වතු වගාකරුවන් හා අක්කර 5 ට අඩු පොල් වගාකරුවන් මෙම කුඩා පරිමාණ වැවිලිකරුවන්ට යටතට ගැනේ. තවද, මෙම කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 72 කට, සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 65 කට හා සමස්ත පොල් නිෂ්පාදයෙන් සියයට 82 කට ද දායකත්වය සපයයි.

වගුව 2.8 > කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශයේ ක්‍රියාකාරීත්වය - 2010 - 2015

| වර්ෂය | තේ | | රබර් | | පොල් | |
|---|---|---|---|---|---|---|
| | භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | සමස්ත නිෂ්පාදනය (කි. ග්‍රෑ. මිලියන) | භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | සමස්ත නිෂ්පාදනය (කි. ග්‍රෑ. මිලියන) | භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | සමස්ත නිෂ්පාදනය (ගෙඩි මිලියන) |
| 2010 | 204,619 | 331 | 125,645 | 153 | 394,836 | 1,900 |
| 2011 | 206,104 | 328 | 128,120 | 158 | 394,836 | 2,303 |
| 2012 | 203,020 | 328 | 130,780 | 152 | 394,836 | 2,411 |
| 2013 | 202,408 | 340 | 133,668 | 130 | 394,836 | 2,061 |
| 2014 | 202,800 | 338 | 134,137 | 99 | 394,836 | 2,890 |
| 2015 | 202,800 | 329 | 134,906 | 89 | 394,836 | 3,027 |

මූලාශ්‍රය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

මෙම කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශයේ නිරත වූවන් දිරිගැන්වීමේ අරමුණින් තේ හා රබර් නැවත වගාකිරීම හා නව වගාවන් සිදු කිරීම සඳහා රජය මඟින් සහනාධාර ලබාදෙනු ලැබේ. ඒ අනුව, තේ නැවත වගා කිරීමට සහ නව වගාවන් සඳහා හෙක්ටයාරයකට පිළිවළින් රුපියල් 500,000 හා රුපියල් 400,000 ක සහනාධාරයක් ද, රබර් නැවත වගාවන් හා නව වගාවන් සඳහා හෙක්ටයාරයකට පිළිවෙළින් රුපියල් 175,000 සහ රුපියල් 150,000 ක සහනාධාරයක් ද ලබාදෙන ලදි.

## 2.4.7 ස්වාභාවික රබර් සඳහා සහතික මිලක් ලබාදීම

2015 අයවැය යෝජනාවක් අනුව කුඩා පරිමාණ රබර් වතු හිමියන් දිරිගැන්වීමේ අරමුණින් ස්වාභාවික රබර් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල් 300/-ක සහතික මිලක් 2014 නොවැම්බර් මස 15 වන දින සිට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ලබාදෙන ලදි. ආරම්භක අදියරේ දී මෙම සහතික මිල දුම් ගැසූ ෂීට් රබර් (ආර්. එස්. එස්. 1, 2, 3, 4 සහ 5) සඳහා පමණක් ලබාදුන් අතර පසුව කුඩා පරිමාණ රබර් කිරි නිෂ්පාදකයින් විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා මෙම සහතික මිල ක්‍රමය රබර් කිරි සඳහා ද ලබාදීමට කටයුතු කරන ලදි.

මෙම කුඩා පරිමාණ රබර් වගාකරුවන් තවදුරටත් දිරිගැන්වීම සහ රබර් කර්මාන්තයේ තිරසාර පැවැත්ම තහවුරු කිරීම සඳහා 2015 අතුරු අයවැය මඟින් මෙම සහතික මිල ස්වාභාවික රබර් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල් 350/- ක් දක්වා ඉහළ නංවන ලදි. ඒ අනුව, කුඩා පරිමාණ රබර් වැවිලිකරුවන් අගය එකතු කළ නිෂ්පාදන කෙරෙහි යොමු කිරීමේ අරමුණින් මෙම නව සහතික මිල ක්‍රමය 2015 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක කළ අතර දේශීය වෙළඳපොලේ රබර් සඳහා වන මිල පදනම් කර ගනිමින් කාණ්ඩ හතරක් යටතේ මේ සඳහා හිමිකම් කියනු ලබන කුඩා පරිමාණ රබර් වැවිලිකරුවන් වෙත අදාළ මිල වෙනස රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ලබාදෙන ලදි. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂය තුළ දී රජය විසින් රුපියල් මිලියන 2,317.75 ක මුදලක් වැය කරන ලදි.

**වගුව 2.9 > ස්වාභාවික රබර් සඳහා සහතික මිල ලබා දීමේ කාණ්ඩ**

| කාණ්ඩය | සහතික මිල (කි. ග්‍රෑ./රු.) | 2015.03.30 දිනට දේශීය වෙළඳපොලේ මිල (කි. ග්‍රෑ./රු.) | ගෙවිය යුතු සහනාධාරය (කි. ග්‍රෑ./රු.) |
|---|---|---|---|
| ආර්. එස්. එස්. 1 සහ 2 | 350 | 210 | 140 |
| ආර්. එස්. එස්. 3 | 325 | 200 | 125 |
| ආර්. එස්. එස්. 4 සහ 5 | 300 | 190 | 110 |
| රබර් කිරි | 300 | 195 | 105 |

*මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව*

## 2.4.8 අමු තේ දළු සඳහා සහතික මිලක් ලබාදීම

අමු තේ දළු සඳහා පැවති වෙළඳපොල මිල දරුණු ලෙස පහත යාමේ අර්බුදයට මුහුණ දීම සඳහා රටෙහි සමස්ත තේ දළු නිෂ්පාදකයන්ගෙන් සියයට 72 කට පමණ දායක වන කුඩා තේ වතු හිමියන්ට අමු තේ දළු සඳහා සහතික මිලක් ලබා දීමට රජය තීරණය කරන ලදි. ඒ අනුව, අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල් 80/- ක සහතික මිලක් දැනට ක්‍රියාත්මක වන තේ කර්මාන්ත ශාලා 712 කට අමු තේ දළු සපයන 400,000 කට ආසන්න කුඩා තේ වතු හිමියන් වෙත 2015 අප්‍රේල් මස සිට ලබා දීමට යෝජනා කරන ලදි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කරනු ලැබූ මෙම යෝජනා ක්‍රමය අනුව කුඩා තේ වතු හිමියන්ට අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල් 80/- කට වඩා අඩු මිලක් ලැබෙන අවස්ථාවලදී කොළඹ තේ වෙන්දේසියේ මිල පදනම් කර ගනිමින් අදාළ මිල වෙනස ගෙවන ලදී.

මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමෙන් සමස්ත තේ නිෂ්පාදනය හා වාර්ෂික තේ අපනයන ආදායම පිළිවෙලින් කිලෝ ග්‍රෑම් මිලියන 30 කින් හා රුපියල් බිලියන 9 කින් ඉහළ දැමීමට

අපේක්ෂා කරන ලදී. මෙම සහතික මිල ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 5,000 ක්, 2015 අතුරු අයවැය මඟින් වෙන් කල ද රජය සත්‍ය වශයෙන් මේ සඳහා වැය කරන ලද මුදල රුපියල් මිලියන 6,738 කි.

### 2.4.9 තේ කර්මාන්ත ශාලා හිමියන් සඳහා වූ කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය

තේ මිල ගණන් පහළ යාම නිසා ලියාපදිංචි තේ කර්මාන්තශාලා මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතාවයන් සැළකිල්ලට ගනිමින් ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා කෙටි කාලීන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට රජය තීරණය කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ බැංකු හරහා ක්‍රියාවට නංවනු ලැබේ.


මෙම ණය සඳහා සියයට 6 ක වාර්ෂික පොළී අනුපාතිකයක් බැංකුව විසින් අය කරනු ලබන අතර සියයට 2 ක පොළී සහනාධාරයක් මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන ආරම්භක දෙවර්ෂය තුළ දී පමණක් ශ්‍රී ලංකා රජය විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ලබා දේ. වසර දෙකකින් පසු සම්පූර්ණ පොළියම අදාළ තේ කර්මාන්තශාලා හිමියන් විසින් ගෙවිය යුතුය. මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට රජය විසින් වර්ෂයකට රුපියල් මිලියන 258 බැගින් දෙවර්ෂයක කාල සීමාවක් සඳහා අරමුදල් වෙන්කොට ඇත. ඒ අනුව, 2015 වර්ෂයේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ණය අයදුම්පත් 551 ලැබී ඇති අතර ඉන් අයදුම්පත් 531 ක් සඳහා රුපියල් මිලියන 10,137 ක පමණ මුදලක් ණය වශයෙන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදීමට අනුමත කරන ලදී.

## 2.5 ආහාර සුරක්ෂිතතාව

### 2.5.1 වී මිල දී ගැනීමේ වැඩසටහන

රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමෙහි ලා වී මඟින් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු වේ. රජය මඟින් පසුගිය වර්ෂවල දී පොහොර සහනාධාරය ලබාදීම, වී සඳහා සහතික මිල නියම කිරීමට, සහනදායී පොළී අනුපාත යටතේ වගා ණය ලබාදීම සහ තාක්ෂණික සහ ව්‍යාප්ති සේවා මඟින් වී ගොවීන් මෙන්ම වී නිෂ්පාදනය ද දිරිගන්වන ලදී. ඒ අනුව, සැපයුම් පාර්ශවයේ බාධාවන් ඇති වූ ඇතැම් අවුරුදුවල හැර වී නිෂ්පාදනය ක්‍රමයෙන් වැඩි වී ඇත. මෙතෙක් වැඩිම වී නිෂ්පාදනය වන මෙ. ටො. මිලියන 4.8 ක ප්‍රමාණය 2015 වර්ෂයේ දී වාර්තා විය. මෙය 2014 වර්ෂයේ වී නිෂ්පාදනය හා සැසඳීමේ දී සියයට 42 ක පමණ වර්ධනයකි. මෙවැනි පසුබිමක් හමුවේ වී මිල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම අභියෝගයක් විය.

2015 වර්ෂයේ රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය (මීට ප්‍රථම ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අමාත්‍යාංශය) විසින් වී අලෙවි මණ්ඩලය හරහා ක්‍රියාත්මක කරන ලදී. 2015 වර්ෂය තුළ වී අලෙවි මණ්ඩලය විසින් වී මෙ. ටො. 335,839 ක් මිල දී ගන්නා ලදී. මෙයින් 2014/15 මහ කන්නයේ දී මිල දී ගත් වී ප්‍රමාණය මෙ. ටො. 160,569 කි. මේ සඳහා මහා භාණ්ඩාගාරය රුපියල් මිලියන 7,500 ක මුදලක් ලබාදෙන ලදී. 2015 යල කන්නයේ දී රාජ්‍ය බැංකු වන මහජන බැංකුව හා ලංකා බැංකුව විසින් ලබාදුන් රුපියල් මිලියන 7,950 ක් වැය කරමින් මිල දී ගත් වී ප්‍රමාණය මෙ. ටො. 175,270 කි. ඒ අනුව වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ රජය විසින් මෙතෙක් දැරූ ඉහළම වියදම 2015 වර්ෂයේ දී සනිටුහන් විය. වී මිල දී ගැනීමේ වැඩසටහනේ විනිවිද භාවය වැඩි දියුණු කරමින් අක්‍රමිකතාවන් සඳහා වන ඉඩ ප්‍රස්තා අවම කිරීම සඳහා 2015 වර්ෂයේ දී වී අලෙවි මණ්ඩලය විසින් වී ගොවීන් ලියාපදිංචි කර ගැනීමේ නව ක්‍රමවේදයක් හඳුන්වාදෙන ලදී.




2015 අතුරු අයවැය යෝජනාවල අංගයක් ලෙස කීරි සම්බා වී සහ අනෙකුත් සම්බා වී වර්ග සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 50/- ක මිලක් ද නාඩු වී සහ අනෙකුත් වී වර්ග සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 45/- ක මිලක් ද ලෙස වීවල රජයේ සහතික මිල සංශෝධනය කරන ලදී. මෙය 2014 වර්ෂයේ වී සඳහා පැවති රජයේ සහතික මිලට සාපේක්ෂව සියයට 20 ක වැඩි වීමකි. වී සඳහා වන නිෂ්පාදන පිරිවැය වාරි ජලයෙන් වගා කිරීමේ දී කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 18.95 ක් ද වැසි ජලයෙන් වගා කිරීමේ දී කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 25.57 ක් ද වන බැවින් සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 22/- ක් වේ. ඒ අනුව, වී කිලෝ ග්‍රෑමයක් සඳහා ගොවීන්ට රුපියල් 25/- ක පමණ ලාභයක් ලැබුණි. වී අලෙවි මණ්ඩලය විසින් එක් එක් ගොවියෙකුගෙන් උපරිම වශයෙන් වී කිලෝ ග්‍රෑම් 2,000 ක් මිල දී ගත් බැවින් එක් ගොවියෙකුට රුපියල් 50,000 ක උපරිම ලාභයක් උපයාගත හැකි විය. කෙසේ වුවද, මෙම ඉහල සහතික මිල ගණන් රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ වී බැහැර කිරීමේ මිල මත අහිතකර බලපෑම් ඇති කරන ලදී. ඒ අනුව, වෙළඳපොල යාන්ත්‍රණයට අනුකූල වන ලෙසත් වී වල නිෂ්පාදන වියදම සමඟ සැසඳෙන ලෙසත් පාරිභෝගිකයාට සහල් සඳහා දැරිය හැකි මිලක් තහවුරු කරමින් වී සඳහා වන රජයේ සහතික මිල සංශෝධනය කිරීමට රජයට සිදුවිය.

වී වල පවතින සහතික මිල සංශෝධනය කිරීමේ දී නිෂ්පාදන පිරිවැය, පාරිභෝගිකයා සඳහා අපේක්ෂිත වෙළඳපොල සහල් මිල සලකා බැලූ අතර වී තොග බැහැර කිරීමේ දී කිසියම් අලාභයක් ඇති වීම වැලැක්වීම පිණිස සැලකිය යුතු සාධාරණ බැහැර කිරීමේ මිලක් (විකුණුම් මිලක්) ඇති කරමින් රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහනේ අක්‍රමිකතාවන් ඇතිවීමේ අවස්ථා අධෛර්යමත් කිරීම ඇතුළු විවිධ කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඒ අනුව, කීරි සම්බා වී කිලෝවක් සඳහා මිල රුපියල් 50/- ක් ද සම්බා වී කිලෝවක් සඳහා මිල රුපියල් 41/- ක් ද නාඩු වී කිලෝවක් සඳහා මිල රුපියල් 38/- ක් ද වශයෙන් මිල සංශෝධනය කරන ලදී. 2016 පෙබරවාරි මාසයේ මැද සිට 2016 අප්‍රේල් මාසයේ මැද දක්වා කාලය තුළ රුපියල් මිලියන 6,240 ක වියදමින් 2015/16 මහ කන්නයේ දී වී මෙ. ටො. 160,000 ක් මිල දී ගැනීමට රජය අපේක්ෂා කරන ලදී. 2016 මැයි මස 10 වන දින වන විට රුපියල් මිලියන 5,141 ක් වැය කරමින් වී මෙ. ටො. 132,021 ක් මිල දී ගෙන ඇත.

වගුව 2.10 > රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ මිල දී ගත් වී ප්‍රමාණය

| කන්නය | නාඩු (මෙ. ටො.) | සම්බා (මෙ. ටො.) | එකතුව (මෙ. ටො.) | වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|
| 2009/10 මහ | 63,850 | 6,919 | 70,769 | 1,995 |
| 2010 යල | 83,819 | 27,910 | 111,729 | 3,184 |
| **එකතුව** | **147,669** | **34,829** | **182,498** | **5,179** |
| 2010/11 මහ | 2,913 | 556 | 3,469 | 98 |
| 2011 යල | 58,967 | 16,205 | 75,172 | 2,137 |
| **එකතුව** | **61,880** | **16,761** | **78,641** | **2,235** |
| 2011/12 මහ | 107,319 | 8,467 | 115,786 | 3,259 |
| 2012 යල | 9,936 | 540 | 10,476 | 294 |
| **එකතුව** | **117,255** | **9,007** | **126,262** | **3,553** |
| 2012/13 මහ | 107,445 | 31,205 | 138,650 | 4,530 |
| 2013 යල | 81,834 | 12,542 | 94,376 | 3,058 |
| **එකතුව** | **189,279** | **43,747** | **233,026** | **7,588** |
| 2013/14 මහ | 3,971 | 592 | 4,563 | 148 |
| 2014 යල | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | **3,971** | **592** | **4,563** | **148** |
| 2014/15 මහ | 126,203 | 34,366 | 160,569 | 7,510 |
| 2015 යල | 162,775 | 12,495 | 175,270 | 7,950 |
| **එකතුව** | **288,978** | **46,861** | **335,839** | **15,460** |
| **මුළු එකතුව** | **809,032** | **151,797** | **960,829** | **34,163** |

*මූලාශ්‍රය : වී අලෙවි මණ්ඩලය*

වී මිල දී ගැනීම සඳහා පෞද්ගලික අංශයෙන් ද සැලකිය යුතු දායකත්වයක් ලැබී ඇත. රාජ්‍ය බැංකු සහ පෞද්ගලික බැංකු විසින් 2015 වර්ෂයේ දී රුපියල් මිලියන 34,440 ක වටිනාකමින් යුතු ඔඩපණ ණය පහසුකම් ලබා දෙමින් පෞද්ගලික අංශයේ වී මිල දී ගැනීමට සහාය දැක්වීය. මෙය 2014 වර්ෂයේ දී ලබාදුන් රුපියල් මිලියන 27,225 ක මුදල් ප්‍රමාණයට සාපේක්ෂව සියයට 27/- ක පමණ වැඩි වීමකි. 2015 වර්ෂය තුළ පෞද්ගලික අංශය වෙත වී මිල දී ගැනීම සඳහා ප්‍රදානය කළ ඔඩපණ ණය මුදල් ප්‍රමාණයෙන් සියයට හැත්තෑ එකක ප්‍රමාණයක් රාජ්‍ය බැංකු විසින් ලබා දී ඇත.

| වගුව 2.11 > පෞද්ගලික අංශයට වී මිල දී ගැනීම සඳහා ලබාදුන් ණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2014/15 මහ | | 2015 යල | | එකතුව | |
| බැංකුව | ණය සංඛ්‍යාව | මුළු ණය මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය මුදල (රු. මිලියන) |
| මහජන බැංකුව | 143 | 1,176.93 | 87 | 673.4 | 230 | 1,850.33 |
| ලංකා බැංකුව | 348 | 9,424.89 | 267 | 12,830.31 | 615 | 22,255.2 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 15 | 34.93 | 44 | 187.82 | 59 | 222.75 |
| රාජ්‍ය බැංකුවල එකතුව | **506** | **10,636.75** | **398** | **13,691.53** | **904** | **24,328.28** |
| කොමර්ෂල් බැංකුව | 39 | 134.85 | 98 | 343.32 | 137 | 478.17 |
| සම්පත් බැංකුව | 185 | 1,564.75 | 138 | 2,188.16 | 323 | 3,752.91 |
| ඩී එෆ් සී සී බැංකුව | 25 | 830.15 | 28 | 739.95 | 53 | 1,570.1 |
| සෙලාන් බැංකුව | 36 | 186.76 | 36 | 199.85 | 72 | 386.61 |
| ජාතික සංවර්ධන බැංකුව | 16 | 711.2 | 30 | 715.2 | 46 | 1,426.4 |
| හැටන් නැෂනල් බැංකුව | 152 | 1,368.4 | 144 | 1,129.6 | 296 | 2,498 |
| **පෞද්ගලික බැංකුවල එකතුව** | **453** | **4,796.11** | **474** | **5,316.08** | **927** | **10,112.19** |
| **මුළු එකතුව** | **959** | **15,432.86** | **872** | **19,007.61** | **1,831** | **34,440.47** |

*මූලාශ්‍රය : අදාළ බැංකු*

## 2.5.2 ගබඩා පහසුකම් සහ ගුදම් කුවිතාන්සි හඳුන්වා දීම

ලෝක බැංකු ආධාර යටතේ ශ්‍රී ලංකා රජය විසින් වී, බඩ ඉරිඟු, සෝයා, තල, කළු කව්පි, ගම්මිරිස් හා රටකජු වැනි ධාන්‍ය වර්ග අස්වනු බහුල කාලයේ දී ගබඩාගත කිරීම සඳහා තෝරාගත් කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල නවීන තාක්ෂණයෙන් යුතු ගබඩා ඉදිකරන ලදි. ඒ අනුව, ගබඩාගත කරන ලද ධාන්‍ය ඇපයට තබා ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව ගොවීන්ට ඇති අතර මෙමඟින් ගුදම් කුවිතාන්සි මූල්‍යකරන ක්‍රමවේදය හඳුන්වා දී ඇත. ඒ අනුව, අනුරාධපුරය, මොණරාගල හා මන්නාරම යන දිස්ත්‍රික්කවල ගබඩා තුනක් ඉදි කරන ලදී. ඉන් අනුරාධපුරය හා මොණරාගල දිස්ත්‍රික්කවල ගබඩා නිම කර ඇති අතර ඒවායේ ධාරිතාවය මෙ.ටො. 16,000 ක් වේ. අනුරාධපුරය - උපුල්දෙණිය පිහිටි ගබඩාවේ ගොවීන් 49 දෙනෙකු තම නිෂ්පාදන ගබඩා කර ඇති අතර ඉන් 19 දෙනෙකු වී සඳහා නිකුත් කළ කුවිතාන්සි ඇපයට තබා කෙටිකාලීන ණය පහසුකම් ලබාගෙන ඇත. මොණරාගල-බුත්තල ගබඩාවේ ගොවීන් 8 දෙනෙකු තම කෘෂි ද්‍රව්‍ය ගබඩා කර ඇති අතර ඉන් දෙදෙනෙකු කුවිතාන්සි ඇපයට තබා කෙටිකාලීන ණය පහසුකම් 2015 අවසන් වන විට ලබාගෙන ඇත.

උපුල්දෙණිය හා බුත්තල ගබඩා භාවිතා කරමින් ගුදම් කුවිතාන්සි ක්‍රමය හඳුන්වා දුන් අතර එය ප්‍රථම වරට ශ්‍රී ලංකාව තුළ මූල්‍ය ආයතන හරහා මෙම ක්‍රමය යටතේ ණය ලබා දීමේ ආරම්භක අවස්ථාවයි. ග්‍රාමීය ප්‍රදේශවල ගොවීන් සඳහා මෙම ධාන්‍ය සඳහා වන කුවිතාන්සි ඇපයට තබා ණය පහසුකම් ලබා ගැනීම මූල්‍ය ආයතන සඳහා විකල්ප ක්‍රමවේදයක් වන අතර එය ප්‍රධාන අභියෝගයක් ද වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන ගබඩා තුනට අමතරව මාතලේ, අනුරාධපුර, පොලොන්නරුව යන දිස්ත්‍රික්ක තුළ ලොකු ලූනු ගබඩා කිරීම සඳහා ගෘහස්ත මට්ටමේ ගබඩා ගොවීනට පෞද්ගලික වන සේ ලබාදෙන ලදි. අස්වැන්න ලැබෙන කාලයේ දී ඇති වන වෙළඳපොල ගැටළු නිරාකරණය කිරීම සඳහා ලොකු ලූනු ගොවීන් සඳහා මෙම වැඩසටහන ඉහත දිස්ත්‍රික්ක තුළ සිදු කරන කරන ලදි. 2015 වසර අවසන් වන විට මුළු ලොකු ලූනු ගබඩා ධාරිතාවය මෙ. ටො. 3,730 ක් වන අතර එය මාතලේ, අනුරාධපුර, පොලොන්නරුව හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවලට පිළිවෙලින් මෙ. ටො. 1,535 ක් මෙ. ටො. 1,425 ක් මෙ. ටො. 470 ක් හා මෙ. ටො. 300 ක් වශයෙන් වෙන්ව පවතී.

## 2.5.3 ලෝක ආහාර වැඩසටහන සඳහා සහල් ප්‍රදානය කිරීම

2013 වර්ෂයේ දී ඇති වූ සැලකිය යුතු ලෙස ඉහළ අස්වැන්න එතෙක් ශ්‍රී ලංකාවේ ඉහළම වාර්ෂික වී නිෂ්පාදනය ලෙස වාර්තා වූ අතර ඒ සමඟ රට තුළ සැලකිය යුතු වී අතිරික්තයක් ඇති විය. ඒ අනුව, අතිරික්ත වී තොග කළමණාකරනය කරන අතරම පහත අරමුණු ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලෝක ආහාර වැඩසටහනට සහල් මෙ. ටො. 50,000 ක් ප්‍රදානය කිරීමට එකඟතාවය පල කරන ලදී.

1. ශ්‍රී ලංකාව ලෝක ආහාර වැඩසටහනේ ආධාර ලාභියකුගේ තත්ත්වයේ සිට එම සංවිධානයට සහල් ප්‍රදානය කරන සැපයුම්කරුවකුගේ තත්ත්වයට පත් කිරීම.

2. අතීතයේ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ගැටුම් නිසා අවතැන් වූ පුද්ගලයින්, මෙන්ම සුනාමි සහ අනෙකුත් ස්වාභාවික විපත් අවස්ථාවල දී ජනතාවට ආහාර ලබාදෙමින් ලෝක ආහාර වැඩසටහන සැපයූ ආධාර අගය කරමින් අපගේ රට ලබා ඇති සංවර්ධනයේ ප්‍රතිලාභ ලෝක ආහාර වැඩසටහන සමඟ අඛන්ඩවම බෙදා ගනිමින් එම සංවිධානය සමඟ තිබූ ද්වි පාර්ශවික සබඳතාව ශක්තිමත් කිරීම.

මෙහි පළමු පියවර ලෙස ශ්‍රී ලංකා රජය විසින් සහල් මෙ. ටො. 10,000 ක් ශ්‍රී ලංකා මානුෂික මෙහෙයුම යටතේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක දේශීය වැඩසටහන සඳහා ලෝක ආහාර වැඩසටහන වෙත ප්‍රදානය කිරීමට එකඟ වූ අතර ඉතිරි මෙ. ටො. 40,000 අන්තර් ජාතික වැඩසටහන යටතේ තෝරාගත් ලෝක ආහාර සංවිධානයේ රටවල් අතර බෙදා දෙනු ඇත. කිසියම් වර්ෂයක් තුළ බෙදා දීමට නියමිත සහල් ප්‍රමාණය තීරණය කිරීම දේශීය පාරිභෝජනය සඳහා අවශ්‍ය වී ප්‍රමාණය වෙන් කිරීමෙන් පසු ඉතිරි වන අතිරික්ත වී ප්‍රමාණය හා ලෝක ආහාර වැඩසටහන විසින් කරනු ලබන ඉල්ලීම් මත පදනම් වේ.

ඒ අනුව, 2015 වර්ෂය අවසන් වන විට රජය විසින් 2015 වර්ෂය තුළ සැපයූ සහල් මෙ. ටො. 292 ත් සමඟ ලෝක ආහාර සංවිධානයට එකඟ වූ පරිදි සහල් මෙ. ටො. 3,341 ක් සපයා තිබුණි. ඉහත සඳහන් මෙ. ටො. 3,341 ක සහල් ප්‍රමාණය සැපයීම සඳහා රජය විසින් රුපියල් මිලියන 232.02 ක සමස්ත පිරිවැයක් දරන ලදී. 2016 මැයි මස 10 වන දින වන විට ශ්‍රී ලංකාව විසින් ලෝක ආහාර සංවිධානය වෙත සහල් මෙ. ටො. 6,341 ක් ප්‍රදානයකර ඇත.

## 2.5.4 සත්ත්ව නිෂ්පාදන අංශයේ සංවර්ධනය

දළ දේශීය නිෂ්පාදිතයට හා අපනයන ආදායමට දායකත්වයක් දැක්වීමේ ඉහළ ප්‍රවනතාවයක් පෙන්නුම් කරන ශ්‍රී ලාංකික කුකුළු නිෂ්පාදන අංශය වර්තමානයේ දී සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව, මෙම ක්ෂේත්‍රය ආශ්‍රිතව පැන නැගෙන ප්‍රශ්න ඉතා ඉක්මණින් නිසි කලට විසඳීමට රජය අපේක්ෂා කරයි. 2015 වර්ෂයේ දී ශ්‍රී ලාංකික කුකුළු නිෂ්පාදන අංශය කුකුළු මස් මෙ. ටො. 164,450 ක් සහ කුකුළු බිත්තර මිලියන 1,899 ක් නිෂ්පාදනය කර ඇති අතර මෙය 2014 වර්ෂයේ කුකුළු මස් නිෂ්පාදනය වූ කුකුළු මස් මෙ. ටො. 150,320 සහ කුකුළු බිත්තර මිලියන 1,721 ක හා සසඳන කළ සැලකිය යුතු වර්ධනයකි. තවද, තම නිෂ්පාදන විදේශ රටවල් කිහිපයකට අපනයනය කිරීම ආරම්භ කරමින් මෙරට ප්‍රධාන කුකුළන් ආශ්‍රිත නිෂ්පාදකයින් කිහිප දෙනෙක්ම ජාත්‍යන්තර වෙළෙඳපොලවල් කරා එළඹීමට සමත්ව ඇත.

කුකුළු ආහාර නිෂ්පාදනයේ දී සියයට 55 ක පමණ දායකත්වයක් දක්වන සංඝටකයක් නිසාවෙන්ම කුකුළු ආහාරවල ප්‍රධානතම සංඝටකයක් ලෙස බඩ ඉරිඟු සලකනු ලැබේ. එමනිසා, කුකුළු ආශ්‍රිත නිෂ්පාදනවල නිෂ්පාදන පිරිවැය කෙරෙහි බඩ ඉරිඟු මිල විශාල වශයෙන් බලපායි. බඩ ඉරිඟු වගා කරන ප්‍රදේශවලට බල පෑ අධික වර්ෂාපතනය නිසා 2015 වර්ෂයේ අපේක්ෂිත බඩ

ඉරිඟු අස්වැන්න පහළ යන ලදි. තවද, 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත බඩ ඉරිඟු අස්වැන්න මෙ. ටො. 277,336 ක් ලෙස වාර්තා වූන අතර සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය වාර්ෂික බඩ ඉරිඟු අවශ්‍යතාවය මෙ. ටො. 350,000 - මෙ. ටො. 400,000 ක් අතර විය. විශේෂයෙන් කුකුළන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රධාන යෙදවුමක් වන බඩ ඉරිඟු තොග දේශීය වෙළෙඳපොලේ ප්‍රමාණවත් පරිදි නොපැවැත්වීම සත්ත්ව ආහාර නිෂ්පාදනයට සෘණාත්මකව බල පෑ හැක. මෙම කරුණ සැලකිල්ලට ගනිමින් තම මාස දෙකක බඩ ඉරිඟු අවශ්‍යතාවය ආනයනය කිරීමට සත්ත්ව ආහාර නිෂ්පාදකයින්ට අවස්ථාව ලබාදෙන ලදි. ඒ අනුව, 2015 අප්‍රේල් මාසයේ සිට බඩ ඉරිඟු මෙ. ටො. 103,000 ක් පමණ සත්ත්ව ආහාර නිෂ්පාදකයින් විසින් ආනයනය කරන ලදි.

## 2.6 ඉලක්කගත කාණ්ඩ සඳහා වූ විශේෂ දිරි දීමනා

### 2.6.1 ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබාදෙන විශේෂ පොළී අනුපාතිකය

තම තරුණ අවධියේ දී රටෙහි සංවර්ධනයට මහත් දායකත්වයක් සැපයූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මූල්‍යමය අතින් ශක්තිමත් හා සුරක්ෂිත විශ්‍රාම දිවියක් ලඟා කර දීමේ අරමුණ ඇතිව වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොළී අනුපාතයක් ලබා දීමට රජය තීරණය කරන ලදි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සියයට 12 ක විශේෂ පොළී අනුපාතයක් ලබා දීමට පසුගිය රජය විසින් 2015 අයවැය මඟින් යෝජනා කරන ලදි.

තවද, 2015 අතුරු අයවැය මඟින් මෙම විශේෂ පොළී අනුපාතය සියයට 15 ක් දක්වා වර්තමාන රජය විසින් ඉහළ නංවන ලදි. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තම සමස්ත තැන්පතු වටිනාකම රුපියල් මිලියන 1 හෝ ඊට අඩු වන ලෙස තනි පුද්ගල පදනම මත තැන්පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මෙම සියයට 15 ක් වන විශේෂ වාර්ෂික පොළී අනුපාතිකය ලැබීමට සුදුසුදුකම් ලබයි. එමෙන්ම මෙම යෝජනාව ක්‍රියාවට නැංවීමේ දී අදාළ බැංකුවලට තම සාමාන්‍ය පොළී අනුපාතයට අමතරව දැරීමට සිදුවන අතිරේක පිරිවැය කාර්තු පදනම මත භාණ්ඩාගාරය විසින් එම බැංකු වෙත ප්‍රතිපූර්ණය කරනු ලබයි.

2015 වර්ෂය තුළ දී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මෙම අමතර පොළිය ගෙවීම වෙනුවෙන් රජය විසින් රුපියල් මිලියන 3,661 ක පමණ මුදලක් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත ප්‍රතිපූර්ණය කර ඇත.

**වගුව 2.12 > ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ පොළී අනුපාතයක් ලබා දීමේ වැඩසටහනේ ප්‍රගතිය - 2015**

| විස්තරය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපූර්ණය කළ මුදල (රු.) |
|---|---|---|
| 1 වන කාර්තුව | 91,240 | 181,864,667.33 |
| 2 වන කාර්තුව | 175,782 | 897,029,886.26 |
| 3 වන කාර්තුව | 196,106 | 1,185,585,616.89 |
| 4 වන කාර්තුව | 229,777 | 1,396,660,535.30 |
| **එකතුව** | **692,905** | **3,661,140,705.78** |

*මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව*

තවද, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වැඩි ප්‍රතිලාභයක් ලබාදීම සඳහා මෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු පිළිබඳ විශේෂ යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී මූල්‍ය ආයතන වෙත ද පුළුල් කිරීමට 2016 අයවැය මඟින් යෝජනා කරන ලදි. ඒ අනුව, වයස අවුරුදු 55 ට වැඩි ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක ආරම්භ කරනු ලබන රුපියල් මිලියන 1.5 ක් හෝ ඊට අඩු තනි පුද්ගල එක් අවුරුදු ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක විශේෂ වාර්ෂික පොළී අනුපාතයක්

ලබාදීමට නියමිතය. පවත්නා වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 4,000 ක් ද යෝජිත නව වැඩසටහන බලපත්‍රලාභී මූල්‍ය ආයතන හරහා ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 1,500 ක් ද වශයෙන් 2016 වර්ෂය සඳහා රජය විසින් අරමුදල් වෙන්කර ඇත.

## 2.6.2 සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා වන ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා වන ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය 2012 වසරේ ජූලි මස ආරම්භ කරන ලද අතර එය ලංකා බැංකුව, මහජන බැංකුව හා ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව හරහා ක්‍රියාත්මක කරන ලදි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ එල් ටී ටී ඊ සංවිධානයේ විවිධ ක්‍රියාකාරකම්වලට සම්බන්ධව සිට මානුෂික මෙහෙයුම අවසානයේ දී ආරක්ෂක හමුදාවන්ට භාර වූ හා අත්අඩංගුවට ගෙන පසුව පුනරුත්ථාපනය කර සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා ණය සපයනු ලබයි.

සමාජගත කරන ලද තරුණ අභ්‍යාසලාභීන්ට තම ජීවන වෘත්තිය සාර්ථක කර ගැනීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මහගු අවස්ථාවක් උදාකර දී ඇත. මෙම තරුණයින් ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් හා ඔවුන්ගේ සමාජ ආර්ථික කටයුතු සංවර්ධනය සඳහා වන පසු අධීක්ෂණ වැඩසටහන් සඳහා සහභාගීවීමට හැකි වේ. තවද, මෙම ණය යෝජනා ක්‍රමය හරහා ඔවුන්ගේ ජීවන වෘත්තිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය ආර්ථික පසුබිම ගොඩනැගෙන අතර යහපත් පුරවැසියෙකු ලෙස සමාජයට මුහුණදීමට හැකිවන ලෙස ශක්තිමත් පදනමක් ගොඩනැගෙයි. ඒ අනුව, සුදුසුකම් ලබන අභ්‍යාසලාභීන්ට කෘෂි හා සත්ත්ව පාලන කටයුතු සඳහා උපකරණ මිලට ගැනීම, කෘෂි ව්‍යාප්ත සේවාවන්, සත්ත්ව පාලනය, යන්ත්‍රෝපකරණ මිලට ගැනීම, ගෘහාශ්‍රිත කර්මාන්ත, ධීවර කටයුතු, සුළු ව්‍යාපාර කටයුතු හා ප්‍රාථමික ද්විතීය/උසස් අධ්‍යාපන සහ වෘතීය පුහුණු යනා දී විවිධ කටයුතු සඳහා වසරක සහන කාලයකට යටත්ව වසර 10 ක ණය ආපසු ගෙවීමේ පදනම මත උපරිමය රුපියල් 250,000/- ක් දක්වා වූ ණය මුදලක් ලබා ගැනීමට හැකි වේ.

පළමු අදියර යටතේ රුපියල් මිලියන 300 ක ණය මුදලක් ලංකා බැංකුව, මහජන බැංකුව හා ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව හරහා පිළිවෙලින් රුපියල් මිලියන 125 ක්, 100 ක් හා 75 ක් ලෙස ලබාදෙන ලදි. මෙම යෝජනා ක්‍රමය යටතේ මහා භාණ්ඩාගාරය විසින් සියයට 8 ක පොළී සහනාධාරයක් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගෙවනු ලැබේ. මෙම ණය යෝජනා ක්‍රමයේ 2015.12.31 දින වන විට පළමු අදියරේ ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 2.13 > 2015.12.31 වන දිනට සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා වන ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද මුදල (රු.) |
|---|---|---|
| යාපනය | 288 | 48,336,000 |
| කිලිනොච්චිය | 342 | 51,984,000 |
| මුලතිව් | 430 | 78,310,000 |
| වව්නියාව | 307 | 47,075,000 |
| මන්නාරම | 270 | 48,700,000 |
| මඩකලපුව | 74 | 11,075,000 |
| මඩකලපුව | 72 | 14,250,000 |
| අම්පාර | 11 | 1,750,000 |
| වෙනත් දිස්ත්‍රික්ක | 5 | 1,150,000 |
| **එකතුව** | **1,799** | **302,630,000** |

*මූලාශ්‍රය : පුනරුත්ථාපන අධිකාරිය*

2015 වසර වන විට විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පලාත්වල ප්‍රතිලාභීන් 1,799 දෙනෙකු සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ප්‍රදානය කරන ලදි. වැඩිම ණය ප්‍රමාණයක් මුලතිව් දිස්ත්‍රික්කයට ලබාදෙන ලද අතර එමගින් අභ්‍යාසලාභීන් 430 ක් සඳහා ප්‍රතිලාභ හිමි වී ඇත. 2015 දෙසැම්බර් වන විට රජය විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා පොළී සහනාධාර ලෙස රුපියල් මිලියන 42 ක් ලබා දී ඇත. මෙම ණය යෝජනා ක්‍රමයේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වූ අතර ඒ සඳහා රුපියල් මිලියන 525 ක ප්‍රතිපාදන ද වෙන් කරන ලදි. පළමු අදියර යටතේ සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් මෙන්ම බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් සමාජගත කරන ලද පුද්ගලයන් සඳහා ද මෙම ණය පහසුකම් ලබාදීමට දෙවන අදියර යටතේ අපේක්ෂා කෙරේ.

## 2.6.3 ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් කලාකරුවන් හා ලේඛකයන් සඳහා වූ විශේෂිත මෝටර් රථ ණය යෝජනා ක්‍රමය

වසර 25 ක අඛණ්ඩ සේවා කාලයක් ඇති ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්, කලාකරුවන් හා ලේඛකයන් සඳහා විශේෂිත ණය යෝජනා ක්‍රමයක් 2012 අයවැය යෝජනාවලට අනුව ආරම්භ කරන ලදි. මෙම ණය යෝජනා ක්‍රමය ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වූ අතර ඒ යටතේ වාහනයක් මිල දී ගැනීම සඳහා රුපියල් මිලියන 1.2 ක උපරිමයකට යටත්ව පොළී රහිත ණය මුදලක් වසර 7 කි න් ආපසු ගෙවීමේ පදනම මත ලබා දෙන ලදි. මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වන ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව තෝරාගන්නා ලද අතර මෙම වැඩසටහන යටතේ ලබාදුන් ණය සඳහා අදාළ මුළු පොළී මුදල සියයට 10 - 14 දක්වා අනුපාතයක් යටතේ පොළී සහනාධාරයක් ලෙස සම්පූර්ණයෙන්ම රජය විසින් අදාළ බැංකු වෙත ප්‍රතිපූර්ණය කරන ලදි. මෙම වැඩසටහනේ 2015.12.31 වන දිනට ප්‍රගතිය පහත දැක්වේ.

**වගුව 2.14 > ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්, කලාකරුවන් හා ලේඛකයන් සඳහා වූ ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය**

| ආයතනය | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව | ප්‍රදානිත ණය ප්‍රමාණය (රු.මි.) | ප්‍රදානිත ණය මුදල (රු. මි.) |
|---|---|---|---|
| ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය | 340 | 395 | 91 |
| සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | 580 | 676 | 115 |
| **එකතුව** | **920** | **1,071** | **206** |

*මූලාශ්‍රය : රාජ්‍ය බැංකු*

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාශය හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් ණය ලබාදීම සඳහා අයදුම්කරුවන් නිර්දේශ කරමින් මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව, 2015 වර්ෂය අවසාන වන විට ප්‍රතිලාභීන් 920 දෙනෙකු සඳහා රුපියල් මිලියන 1,071 ක ණය පහසුකම් ප්‍රදානය කර ඇත. මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 206 ක් පොළී සහනාධාර ගෙවීම් සඳහා එම කාලපරිච්ඡේදය තුළ වැය කර ඇත.

## 2.6.4 උකස් අත්තිකාරම් සඳහා සහන සැලසීම

ඉහළ යන ජීවන වියදම අඩු කිරීම මගින් ජනතාවට සහන සැලසීම සඳහා රජය විසින් විශේෂ උපක්‍රම කිහිපයක්ම ක්‍රියාවට නංවන ලදී. ඉහළ යන ජීවන වියදම් ගැටළුව නිසා ජනතාව විසින් තම එදිනෙදා අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමේ අරමුණින් ක්ෂණික ණය පහසුකම් ලබා ගැනීමට තම දෙමව්පියන්ගේ හා සමීප ඥාතීන්ගෙන් මතක සටහන් ලෙස ලැබුණු රන් භාණ්ඩ උකස් කර තිබුණි. වැඩි පිරිසක් මෙම ණය මුදල් තම එදිනෙදා පරිභෝජනයට ගෙන තිබූ අතර බැංකු විසින් මෙම උකස් ණය සඳහා අය කළ ඉතා ඉහළ පොළිය ද හේතුවෙන් අවසානයේ දී එම උකස් ණය පියවීමට මෙම ජනතාව අපොහොසත් වී

තිබුණි. මෙම දුප්පත් ජනතාව තම උකස් ණය පියවීමට අවිධිමත් මූලාශ්‍ර හරහා තවත් ණය ලබාගෙන ණය උගුලේ තව තවත් සිර වී තිබුණි.

මෙම අවාසනාවන්ත තත්ත්වය අවබෝධ කරගත් රජය ඉහළ පොළියක් යටතේ තම රන් භාණ්ඩ උකස් කර ඇති ජනතාවගේ රන් භාණ්ඩ 2015 මාර්තු මස 15 වන දා සිට 2015 ජුනි මස 30 වන දා අතර වූ විශේෂ කාල සීමාව තුළ බේරා ගැනීමේ දී ඒ සඳහා අයකරනු ලබන වැඩි පොළිය කපා හැරීමට යෝජනා කරන ලදි.

ඒ අනුව, තම රන් භාණ්ඩ රාජ්‍ය බැංකුවල උකස් කොට රුපියල් 200,000 ක උපරිමයක් දක්වා උකස් ණය ලබාගෙන ඇති ජනතාව මෙම සහනය ලබා ගැනීමට සුදුසුකම් ලැබීය. මෙම යෝජනා ක්‍රමය සාර්ථකව අවසන් කරන ලද අතර මේ යටතේ 36,011 ක් වූ ප්‍රතිලාභීන් පිරිසකගේ වැඩි පොළිය කපා හැරීම වෙනුවෙන් සහභාගීත්ව රාජ්‍ය බැංකු 7 ක් වෙත රුපියල් මිලියන 94.06 ක් ලබා දෙන ලදි.

**වගුව 2.15 > සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා පොළී සහනාධාර ගෙවීම**

| මාසය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල (රු.) |
|---|---|---|
| මාර්තු | 5,621 | 11,553,130.45 |
| අප්‍රේල් | 9,367 | 21,375,805.49 |
| මැයි | 12,971 | 33,302,688.74 |
| ජුනි | 8,052 | 27,833,272.88 |
| **එකතුව** | **36,011** | **94,064,897.56** |

*මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව*

# 3. පරිපාලන හා මූල්‍ය කාර්ය සාධනය

## 3.1 පරිපාලන අංශය

අධ්‍යක්ෂ ජනරාල්ගේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, 29 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන් විත වේ. එකී කාර්යය මණ්ඩලය මාණ්ඩලික නිලධාරීන් 10 දෙනෙකු හා සෙසු නිලධාරීන් 19 දෙනෙකුගෙන් සමන් විත වේ. 2015 වසර අවසන් වන විට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වන අතර එයින් තවදුරටත් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව දෙකකි. දෙපාර්තමේන්තුවේ පරිපාලන, මූල්‍ය හා මානව සම්පත් සංවර්ධනයට අදාළ 2015 වසරේ තොරතුරු පහත පරිදි වේ.

### 3.1.1 කාර්යය මණ්ඩලය

**වගුව 3.1 > දෙපාර්තමේන්තු අනුමත කාර්ය මණ්ඩලය**

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | මෙහෙයුම් කාර්යය මණ්ඩලය |
|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 |
| 03 | අධ්‍යක්ෂ | 04 | 04 |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 04 | 04 |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ - ගණකාධිකාරි | 01 | 01 |
| 05 | සැලසුම් සහකාර | 01 | 01 |
| 06 | පර්යේෂණ සහකාර | 02 | 01 |
| 07 | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | 01 | 01 |
| 08 | කළමනාකරණ සහකාර | 06 | 06 |
| 09 | රියදුරු | 06 | 06 |
| 10 | කා.කා.ස. | 04 | 04 |
| ***එකතුව*** | | ***31*** | ***29*** |

2015 වසර තුළ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ නිලධරයන්

1. එන් ඒ කේ සමරනායක මෙය - සහකාර අධ්‍යක්ෂ
2. බී ඒ කේ එස් පී ජයවීර මිය - කළමනාකරණ සහකාර
3. ඩී පවනි සඳුනිකා මෙය - කළමනාකරණ සහකාර
4. එස්.ඒ. කීර්තිසේන මයා - රියදුරු
5. ඩබ් ඩී ඒ වික්‍රමසිංහ මයා - රියදුරු
6. ඩී ඊ කේ පැලවත්ත මයා - කාර්යාල කාර්ය සහායක

2015 වසර තුළ ස්ථානමාරු ලබා ඉවත්ව ගිය නිලධරයන්

1. පී.එච්.එස්. සමරවික්‍රම මිය - කළමනාකරණ සහකාර
2. කේ.ජී.ඒ. කුමාරසිරි මයා - රියදුරු
3. කේ. පී.අයි. චමින්ද මයා - කාර්යාල කාර්ය සහායක

## 3.1.2 කාර්යය මණ්ඩල තොරතුරු

වගුව 3.2 > දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය තොරතුරු

| නම | තනතුර | සම්බන්ධ කළ හැකි තොරතුරු | | |
|---|---|---|---|---|
| | | දුරකථන | ෆැක්ස් | විද්‍යුත් තැපැල |
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ ජනරාල් | 2484542 | 2394908 | dgdf@dfd.treasury.gov.lk<br>atapattu@dfd.treasury.gov.lk |
| ඕ.එම්. ජාබීර් මයා | අධ්‍යක්ෂ | 2484507 | 2484955 | mjabeer@dfd.treasury.gov.lk |
| එම්.කේ.ඩී.එන්. මාදම්පෙ මිය | අධ්‍යක්ෂ | 2484605 | 2484955 | nilukad@dfd.treasury.gov.lk |
| පී.එම්.කේ. හෙට්ටිආරච්චි මහතා | අධ්‍යක්ෂ | 2484572 | 2484955 | manjulap@dfd.treasury.gov.lk |
| එච්.එස්.වී. කුමාර මයා | අධ්‍යක්ෂ | 2484595 | 2484955 | hemanthak@dfd.treasury.gov.lk |
| ඩබ්ලිව්.එල්.එම්.ඒ. ලියනගේ මිය | ගණකාධිකාරි | 2484594 | 2484955 | liyanagem@dfd.treasury.gov.lk<br>manorigl@yahoo.com |
| ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484596 | 2484955 | ranithad@dfd.treasury.gov.lk<br>radranitha@gmail.com |
| ජේ.ඩී. කොටින්කඩුව මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484854 | 2484955 | dilrukshij@dfd.treasury.gov.lk<br>jdilkotink aduwa@yahoo.com |
| දිලුමි ඩබ්. කුමාරගුරු මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484501 | 2484955 | dilumiw@dfd.treasury.gov.lk |
| එන් ඒ කේ සමරනායක මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484501 | 2484955 | kesalas@ dfd.treasury.gov.lk |

| නම | තනතුර | සම්බන්ධ කළ හැකි තොරතුරු | | |
|---|---|---|---|---|
| | | දුරකථන | ෆැක්ස් | විද්‍යුත් තැපෑල |
| එච්.පී.එස්. ශාන්ත මහතා | සැලසුම් සහකාර | 2484884 | 2484955 | shantha@dfd.treasury.gov.lk |
| ඒ.එම්. වික්‍රමසිංහ මෙය | පර්යේෂණ සහකාර | 2484884 | 2484955 | amanthiw@dfd.treasury.gov.lk |
| පී.එච්.එස්. සමරවික්‍රම මිය | කළමනාකරණ සහකාර | 2484855 | 2484955 | - |
| ටී. හේවාවසම් මිය | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | - |
| එච්.ඒ.ඩී.ඒ. නිලන්ති මිය | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | - |
| ආර්.කේ. ලෙනෝරා මයා | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | - |
| එස්.එස්.එච්.එම්.ඩබ්.කේ. සෙනෙවිරත්න මයා | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | - |
| බී ඒ කේ එස් පී ජයවීර මිය | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | - |
| ඩී පවනි සඳුනිකා මෙය | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | - |
| ජේ. එම්. අයි. ඒ. ගීෂානි මෙය | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | 2484884 | 2484955 | - |
| කේ. ජී. ඒ. කුමාරසිරි මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| එම්. එන්. එල්. ප්‍රේමතිලක මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| ඩබ් ඩී ඒ වික්‍රමසිංහ මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| කේ. ඩී. ඩී. ගුණසේකර මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| එම්.පී. ගුණවර්ධන මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| එස්. ඒ. කීර්තිසේන මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| පී. එච්. සී. එස්. ද සිල්වා මයා | රියදුරු | 2484855 | 2484955 | - |

| නම | තනතුර | සම්බන්ධ කළ හැකි තොරතුරු | | |
|---|---|---|---|---|
| | | දුරකථන | ෆැක්ස් | විද්‍යුත් තැපැල |
| ආර්.එම්. කුලතුංග මයා | කාර්යාල කාර්ය සහායක | 2484855 | 2484955 | - |
| කේ. පී. අයි. චමින්ද මයා | කාර්යාල කාර්ය සහායක | 2484855 | 2484955 | - |
| ජේ. එම්. ඩී. ජේ. එස්. හේමන්ත මයා | කාර්යාල කාර්ය සහායක | 2484855 | 2484955 | - |
| එම්. ආර්. ජයසිංහ මයා | කාර්යාල කාර්ය සහායක | 2484855 | 2484955 | - |
| ඩි. ඒ. කෝ පැලවත්ත මයා | කාර්යාල කාර්ය සහායක | 2484855 | 2484955 | - |

### 3.1.3 දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

වගුව 3.4 > දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ 2015 වසරේ දේශීය පුහුණු

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත් වූ ආයතනයෙහි නම |
|---|---|---|---|
| එම්. කේ. ඩී. එන්. මාදම්පෙ මිය - අධ්‍යක්ෂ | ඉ-රාජ්‍ය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2015.11.23 | මිලෝදා ආයතනය |
| එන්. ඒ. කේ. සමරනායක මෙය - සහකාර අධ්‍යක්ෂ | ඉ-රාජ්‍ය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2015.11.23 | මිලෝදා ආයතනය |
| දිලුමි ඩබ්. කුමාරගුරු මෙය -සහකාර අධ්‍යක්ෂ | ඉ-රාජ්‍ය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2015.11.23 | මිලෝදා ආයතනය |
| එච්. පී. එස්. ශාන්ත මයා සැලසුම් සහකාර | ඉ-රාජ්‍ය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2015.11.23 | මිලෝදා ආයතනය |
| | පරිගණක මෘදුකාංග පිළිබඳ පුහුණු වැඩසටහන | 2015.08.10-2015.08.11 | මිලෝදා ආයතනය |
| ටී. හේවාවසම් මිය කළමනාකරණ සහකාර | “Excel” පිළිබඳ උසස් විශ්ලේෂණ මෙවලම් | 2015.09.28 (එක් දින) | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය |
| ආර්.කේ. ලෙනෝරා මයා කළමනාකරණ සහකාර | පරිගණක මෘදුකාංග පිළිබඳ පුහුණු වැඩසටහන | 2015.08.10-2015.08.13 | මිලෝදා ආයතනය |
| එස්. එස්. එච්. එම්. ඩබ්. කේ. සෙනෙවිරත්න මයා කළමනාකරණ සහකාර | පරිගණක මෘදුකාංග පිළිබඳ පුහුණු වැඩසටහන | 2015.08.10-2015.08.12 | මිලෝදා ආයතනය |
| පී. එච්. සී. එස්. ද සිල්වා මයා - රියදුරු | ආකල්ප හා වෘතීය දැනුම ඉහළ නැංවීම පිළිබඳ වැඩමුළුව | 2015.06.26-2015.06.27 | නිපුණතා පියස |

## 3.1.4 විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

වගුව 3.5 > දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ 2015 වසරේ විදේශීය පුහුණු

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත්වූ රටෙහි නම |
|---|---|---|---|
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මයා අධ්‍යක්ෂ ජනරාල් | සංවර්ධනය මූල්‍යනය පිළිබඳ තුන්වන අන්තර් ජාතික සමුළුවේ දෙවන අධියර. | 2015.04.13 - 2015.04.17 | ඇමරිකා එක්සත් ජනපදය |
| | සංවර්ධනය මූල්‍යනය පිළිබඳ තුන්වන අන්තර් ජාතික සමුළුව. | 2015.06.15 - 2015.06.19 | ඇමරිකා එක්සත් ජනපදය |
| | සංවර්ධනය මූල්‍යනය පිළිබඳ තුන්වන අන්තර් ජාතික සමුළුව. | 2015.07.13 - 2015.07.16 | ඉතියෝපියාව |
| | රාජ්‍ය අභිවෘද්ධිය නගාසිටුවීම සඳහා වන නායකත්ව පුහුණුව. | 2015.09.20 - 2015.09.25 | ඇමරිකා එක්සත් ජනපදය |
| | ප්‍රතිපත්ති හා නායකත්වය පිළිබඳ රාජ්‍ය අංශයේ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අධ්‍යයන චාරිකාව | 27.11,2015-07.12.2015 | ඔස්ට්‍රේලියාව |
| ඕ.එම්. ජාබීර් මයා අධ්‍යක්ෂ | විදේශ ආයෝජන ආකර්ශනය සම්බන්ධ පුහුණු වැඩමුළුව | 2015.05.10-2015.05.17 | සිංගප්පූරුව |
| | වැඩිහිටියන් සඳහා රක්ෂණ ආවරණයක් සැකසීම පිළිබඳ ඉහළපෙලේ සම්මේලනය. | 2015.08.21 2015.09.03 | චීනය |
| එස්.එච්.වී. කුමාර මයා අධ්‍යක්ෂ | ආර්ථික සංවර්ධනය උපායමාර්ග. | 2015.09.09-2015.09.24 | කොරියාව |
| එම්.කේ.ඩී.එන්. මාදම්පෙ මිය අධ්‍යක්ෂ | 71 වන එක්සත් ජාතීන්ගේ ආසියානු පැසිපික් කලාපයේ අධ්‍යාපනික, සමාජීය හා සංස්කෘතික සමුළුව. | 2015.05.24-2015.05.30 | තායිලන්තය |
| | කලාපීය ආර්ථික හා මූල්‍ය අධීක්ෂණ විධායක වැඩමුළුව. | 2015.10.04-2015.10.10 | කොරියාව |

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත්වූ රටෙහි නම |
|---|---|---|---|
| පී.එම්.කේ. හෙට්ටිආරච්චි මයා<br>අධ්‍යක්ෂ | සුළු හා මධ්‍ය පරිමාණ ආසියානු සම්මේලනය. | 2015.05.25-2014.05.29 | මැලේසියාව |
| ආර්.ජී.ඩී.ආර්. රණසිංහ මෙය<br>සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය ප්‍රතිපත්ති සහ උපායමාර්ගයන්හි ධාරිතාව වර්ධනය කිරීම. | 2015.10.11-2015.11.02 | කොරියාව |
| ජේ.ඩී. කොටින්කඩුව මෙය<br>සහකාර අධ්‍යක්ෂ | ගෝලීය ආර්ථිකය හා සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා චීන සමුහාණ්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති. | 2015.05.18-2015.06.11 | චීනය |
| දිලුම් ඩබ්. කුමාරගුරු මෙය<br>සහකාර අධ්‍යක්ෂ | සංවර්ධනය වෙමින් පවතින රටවල අභ්‍යන්තර කලාපයන් ආශ්‍රිත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය. | 2015.10.14-2015.11.05 | චීනය |
| එච්.පී.එස්. ශාන්ත මයා<br>සැලසුම් සහකාර | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අපනයන අභිමුඛ ආර්ථිකයක් පිළිබඳ සම්මේලනය. | 2015.10.15-2015.11.07 | චීනය |
| ජී.එම්. වික්‍රමසිංහ මෙය<br>පර්යේෂණ සහකාර | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා නිදහස් වෙළඳ කලාප පිළිබඳ ක්‍රමෝපායන් පිළිබඳ සම්මේලනය. | 2015.06.29-2015.07.23 | චීනය |
| ජේ.එම්.අයි.ජී. ගීෂානි මෙය<br>තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන සහකාර | තොරතුරු තාක්ෂණ පිළිබඳ පශ්චාත් උපාධිය. | 2015.08.10-2015.12.23 | කොරියාව |


## 3.2 මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් 3,608,656,160 ක ප්‍රතිපාදනයක් ද ප්‍රාග්ධන වියදම් සඳහා 3,430,790,000 ක ප්‍රතිපාදන ද වශයෙන් රුපියල් 7,039,446,160 ක මුළු ප්‍රතිපාදන මුදලක් 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් වැය ශීර්ෂ 243 වැඩසටහන 01 හා වැඩසටහන 02 යටතේ වෙන්කර තිබුණි. වසර තුළ මුළු සත්‍ය වියදම 6,840,253,313 ක් වූ අතර සත්‍ය පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රුපියල් 3,586,083,725 ක් හා 3,254,169,587 ක් විය. එකී වර්ෂය තුළ එම වියදම බෙදී ගිය ආකාරයත්, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ විස්තරත් පිළිවෙලින් පහත වගු අංක 3.6 සහ 3.7 මඟින් පෙන්නුම් කෙරේ.

**වගුව 3.6 > අයවැය ඇස්තමේන්තු උපයෝජනය - 2015**

| වැය විෂය | ඇස්තමේන්තුව (රු.) | සත්‍ය වියදම (රු.) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **3,608,656,160.00** | **3,586,083,725.00** |
| පුද්ගල පඩි නඩි | 17,985,000.00 | 17,694,995.00 |
| ගමන් වියදම් | 1,578,000.00 | 1,514,383.00 |
| සැපයීම් | 1,726,040.00 | 1,655,140.00 |
| නඩත්තු වියදම් | 1,405,000.00 | 1,365,462. |
| සේවා | 2,201,500.00 | 2,124,127.00 |
| සංවර්ධන සහනාධාර (පොළී සහනාධාර) | 3,577,410,160.00 | 3,555,392,605.00 |
| වෙනත් මාරු කිරීම් | 6,350,460.00 | 6,337,013.00 |
| **මූලධන වියදම්** | **3,430,790,000.00** | **3,254,169,587.00** |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | 415,000.00 | 406,888.00 |
| හැකියා වර්ධනය | 1,450,000.00 | 1,449,075.00 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 267,000,000.00 | 241,299,529.00 |
| සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය ( ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 2,410,000,000.00 | 2,341,356,882.00 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වැඩි දියුණු කිරීම (ශ්‍රී ලංකා රජය/ජර්මන් රජය) | 274,925,000.00 | 248,037,401.00 |
| ගෝලීය ආහාර අර්බුදයට ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 477,000,000.00 | 421,619,811.00 |
| **මුළු එකතුව** | **7,039,446,160.00** | **6,840,253,313.00** |

*මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව*




**වගුව 3.7 > රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2015**

| විස්තරය | අනුමත සීමාව (රු.) | සත්‍ය මුදල් වටිනාකම (රු.) |
|---|---|---|
| වියදම් උපරිම සීමාව | 9,000,000 | 4,313,184 |
| ලැබීම්වල අවම සීමාව | 655,000 | 1,150,948 |
| හර ශේෂයේ උපරිම සීමාව | 2,655,000 | 1,779,338 |

*මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව*

## 3.3 විගණන විමසුම්

විගණකාධිපති දෙපාර්තමේන්තුව හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දුන් අතර ඔවුන් විසින් පෙන්වා දෙන ලද දුර්වලතා මග හරවා ගැනීමට ද අවශ්‍ය පියවර ගන්නා ලදී.

**වගුව 3.8 > විගණන විමසුම් - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - 2015**

| # | ලද දිනය | විෂය | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට පිළිතුරු යැවූ දිනය |
|---|---|---|---|
| 1. | 2015.05.07 | පළමු කාර්තුව සඳහා කළමනාකරණ විගණන වාර්තාව | 2015.05.12 |
| 2. | 2015.08.04 | දෙවන කාර්තුව සඳහා කළමනාකරණ විගණන වාර්තාව | 2015.08.23 |
| 3. | 2015.10.07 | තුන්වන කාර්තුව සඳහා කළමනාකරණ විගණන වාර්තාව | 2015.10.13 |
| 4. | 2015.10.30 | තුන්වන කාර්තුව සඳහා කළමනාකරණ විගණන වාර්තාව | 2015.11.13 |
| 5. | 2016.03.14 | හතරවන කාර්තුව සඳහා කළමනාකරණ විගණන වාර්තාව | 2016.03.28 |

**වගුව 3.9 > විගණන විමසුම් - විගණකාධිපති දෙපාර්තමේන්තුව - 2015**

| # | ලද දිනය | විෂය | විගණකාධිපති දෙපාර්තමේන්තුවට පිළිතුරු යැවූ දිනය |
|---|---|---|---|
| 1. | 2015.04.28 | විසර්ජන ගිණුම - 2014 | 2015.05.05 |
| 2. | 2015.07.20 | වාහන පාලනය - 2014 | 2015.08.09 |
| 3. | 2015.07.29 | කාර්ය සාධනය - 2014 | 2015.08.11 |
| 4. | 2015.09.01 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ විගණන වාර්තාව - 2014 | 2015.09.14 |
| 5. | 2015.09.01 | 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාව | 2015.09.09 |
| 6. | 2016.02.17 | ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය | 2016.03.01 |